**තරඟ ඉසව්ව - මීටර් 100 X 4**

| ස්ථානය | ඒකකය | නම | | දක්ෂතාවය |
|---|---|---|---|---|
| 1 වන ස්ථානය | 14 රණජීවීප්‍ර ශ්‍රීලංඉ | සෙ/246149 | ලාරැකෝ කුමාර ආර්පී | 45.7 තත් |
| | | සෙ/246148 | ඉසෙ ප්‍රියසාද් සීඒ | |
| | | සෙ/248612 | ඉසෙ ජයතිලක එන්එම්බී | |
| | | සෙ/248427 | ඉසෙ අනිද්‍රාජ් පී | |
| 2 වන ස්ථානය | 4 (සෙවි) ශ්‍රීලංඉ | සෙ/ඕ101576 | ඉසෙ ධණුෂ්ක වයිඑම් | 47.5 තත් |
| | | සෙ/ඕ100675 | ඉසෙ රත්නායක ආර්එම්ටීඑස් | |
| | | සෙ/4ඕ02731 | ඉසෙ රුවන් කුමාර පීකේජේ | |
| | | සෙ/94479 | ඉසෙ ප්‍රනාන්දු කේඑන් | |
| 3 වන ස්ථානය | 8 ශ්‍රීලංඉ | සෙ/242902 | ලා/කෝ තරංග කේඑම්ආර්එස් | 48.4 තත් |
| | | සෙ/247766 | ඉසෙ තරංග පීසී | |
| | | සෙ/247852 | ඉසෙ ගුණසේකර පීඑම් | |
| | | සෙ/248278 | ඉසෙ කුලතුංග කේඩී | |

**තරඟ ඉසව්ව - මීටර් 200 X 4**

| ස්ථානය | ඒකකය | නම | | දක්ෂතාවය |
|---|---|---|---|---|
| 1 වන ස්ථානය | 14 රණජීවීප්‍ර ශ්‍රීලංඉ | සෙ/244278 | ලා/කෝ කාරියවසම් සීකේඒඑල් | 1.34.0 මිනි |
| | | සෙ/246148 | ඉසෙ ප්‍රියසාද් සීඒ | |
| | | සෙ/248612 | ඉසෙ ජයතිලක එන්එම්බී | |
| | | සෙ/248427 | ඉසෙ අනිද්‍රාජ් පී | |
| 2 වන ස්ථානය | 4 (සෙවි) ශ්‍රීලංඉ | සෙ/ඕ101576 | ඉසෙ ධණුෂ්ක වයිඑම් | 1.35.3 මිනි |
| | | සෙ/ඕ100675 | ඉසෙ රත්නායක ආර්එම්ටීඑස් | |
| | | සෙ/4ඕ02731 | ඉසෙ රුවන් කුමාර පීකේජී | |
| | | සෙ/ඕ100854 | ඉසෙ කුමාර කේඑල්එස්යු | |
| 3 වන ස්ථානය | 1 ශ්‍රීලංඉ | සෙ/242031 | ලාරැකෝ දිනේෂ් කුමාර එස්ආර් | 1.38.0 මිනි |
| | | සෙ/248724 | ඉසෙ සෙනෙවිරත්න ඩබ්ජී | |
| | | සෙ/247512 | ඉසෙ ගුණවර්ධන | |
| | | සෙ/246909 | ඉසෙ සමිත් කුමාර | |

**තරඟ ඉසව්ව - මීටර් 400 X 4**

| ස්ථානය | ඒකකය | නම | | දක්ෂතාවය |
|---|---|---|---|---|
| 1 වන ස්ථානය | 14 රණජීවීප්‍ර ශ්‍රීලංඉ | සෙ/244278 | ලා/කෝ කාරියවසම් ඩිකේව්වල් | 3.30.5 මිනි |
| | | සෙ/243826 | ලා/කෝ ක්‍රිශාන්ත ඩබ්කේවල් | |
| | | සෙ/248612 | ඉසෙ ජයතිලක එන්බීවම් | |
| | | සෙ/248427 | ඉසෙ අනිදිරාජ් පී | |
| 2 වන ස්ථානය | 4 (සෙව්) ශ්‍රීලංඉ | සෙ/ඛී101576 | ඉසෙ ධණුෂ්ක වයිවම් | 3.32.8 මිනි |
| | | සෙ/ඛී100675 | ඉසෙ රත්නායක ආර්එම්ටීඑස් | |
| | | සෙ/4ඛී02731 | ඉසෙ රුවන් කුමාර පීකේජේ | |
| | | සෙ/4ඛී100854 | ඉසෙ කුමාර කේවල්යූඑස් | |
| 3 වන ස්ථානය | 7 ශ්‍රීලංඉ | සෙ/248851 | ලා/කෝ සිරිවික්‍රම එස්වම් | 3.52.3 මිනි |
| | | සෙ/242741 | ලා/කෝ රවින්ද්‍ර එම්පීවම්වම්ඩී | |
| | | සෙ/246432 | ලා/කෝ පල්ලේවල වච්වම් | |
| | | සෙ/245531 | ඉසෙ අධිකාරි ඒවම් | |

**තරඟ ඉසව්ව - මෙඩ්ලි රිලේ**

| ස්ථානය | ඒකකය | නම | | දක්ෂතාවය |
|---|---|---|---|---|
| 1 වන ස්ථානය | 14 ශ්‍රීලංඉ | සෙ/246149 | ලා/කෝ කුමාර ආර්පී | 2.02 මිනි |
| | | සෙ/246148 | ඉසෙ ප්‍රියසාද් සීච් | |
| | | සෙ/248612 | ඉසෙ ජයතිලක එන්වම්බී | |
| | | සෙ/248427 | ඉසෙ අනිදිරාජ් පී | |
| 2 වන ස්ථානය | 4 (සෙව්) ශ්‍රීලංඉ | සෙ/ඛී101576 | ඉසෙ ධණුෂ්ක වයිවම් | 2.05 මිනි |
| | | සෙ/ඛී100675 | ඉසෙ රත්නායක ආර්එම්ටීඑස් | |
| | | සෙ/4ඛී02731 | ඉසෙ රුවන් කුමාර පීකේජේ | |
| | | සෙ/ඛී100854 | ඉසෙ කුමාර කේවල්එස්යූ | |
| 3 වන ස්ථානය | 1 ශ්‍රීලංඉ | සෙ/247512 | ඉසෙ ගුණවර්ධණ බීවම්සීසී | 2.13 මිනි |
| | | සෙ/247724 | ඉසෙ සෙනවිරත්න | |
| | | සෙ/246909 | ඉසෙ සමිත් කුමාර | |
| | | සෙ/242031 | ලා/කෝ දිනේෂ් කුමාර | |

**තරඟ ඉසව්ව - මීටර් 400, 800, 1500 (කාන්තා)**

| ස්ථානය | ඒකකය | නම | |
|---|---|---|---|
| 1 වන ස්ථානය | 15 (සෙව්) ශ්‍රීලංඉ | සෙ/ඛී101680 | කෝප්‍රල් සමරසිංහ එම්ඩීසීකේ |

**තරඟ ඉසව්ව - තුන්පිම්ම, දුර පැනීම, මීටර් 100 (කාන්තා)**

| ස්ථානය | ඒකකය | නම | |
|---|---|---|---|
| 1 වන ස්ථානය | 15 (සෙව්) ශ්‍රීලංඉ | සෙ/ඛී 101689 | ලා/කෝ සිතාරා වල්ව්පේ |

**තරඟ ඉසව්ව - හෙල්ල විසිකිරීම, යගුලිය විසිකිරීම, කවපෙත්ත විසිකිරීම (කාන්තා)**

| ස්ථානය | ඒකකය | නම | |
|---|---|---|---|
| 1 වන ස්ථානය | 4 (සෙව්) ශ්‍රීලංඉ | සෙ/ඛී101629 | කෝප්‍රල් සෙව්වන්දි යුඑ්සීවන් |

සමස්ථ තරඟාවලියේ ඒකක වශයෙන් ලකුණු ලබා ගැනීම පහත පරිදි දැක්විය හැක.

| ඒකකය | 1 කාළරේ | 5 කාළරේ | 6 කාළරේ | 7 කාළරේ | 8 කාළරේ | 9 කාළරේ | 10 කාළරේ | 11 කාළරේ | 12 කාළරේ | 14 රණජීවීප්‍ර ශ්‍රීලංඉ | 16 වැඩිපල ශ්‍රීලංඉ | 4 (සෙව්) ශ්‍රීලංඉ | 15 (සෙව්) ශ්‍රීලංඉ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුලු ලකුණු | 55 | 12 | 26 | 21 | 26 | 16 | 21 | 32 | 14 | 120 | 0 | 84 | 0 |

ත්‍යාග ප්‍රධානය සහ සමාප්ති උත්සවය සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු සහ ශ්‍රීලංකා යුධ හමුදා කාන්තා බළකා බළකාධිපති මේජර් ජෙනරාල් ඩීඑස් වීරමන් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමන් සහභාගී වූ අතර, තරඟාවලියේ අවසාන ඉසව් වශයෙන් මීටර් 100 අවසන් මහා තරඟය, 400 x 4 දිව්මේ තරඟය පවත්වන ලදී. සමස්ථ තරඟාවලියේ ශූරතාවය ලකුණු 120 ලබාගත් 14 රසායනික ජීව විද්‍යාත්මක, විකිරණශීලී සහ න්‍යෂ්ඨික ප්‍රතිචාර දැක්වීමේ රෙජිමේන්තු මලල ක්‍රීඩා කණ්ඩායම විසින් හිමි කර ගන්නා ලද අතර, දෙවන හා තෙවන ස්ථානයන් පිලිවෙලින් 4 (සෙව්) ශ්‍රීලංඉ ඒකකය සහ 1 කාඉරෙ ශ්‍රිලංඉ ඒකකයන් විසින් හිමිකර ගන්නා ලදී.



තරඟාවලියේ මීටර් 400 ඉසව්ව තත්පර 50.2 තුලදී නිම කල 14 රසායනික ජීව විද්‍යාත්මක, විකිරණශීලී සහ න්‍යෂ්ඨික ප්‍රතිචාර දැක්වීමේ රෙජිමේන්තුවට අයත් සෙ/248612 ඉසෙ ජයතිලක එන්එම්බී විසින් තරඟාවලියේ දක්ෂතම ජවන ක්‍රීඩකයාට හිමි සම්මානය හිමි කර ගත් අතර, උස පැනිමේ ඉසව්වෙන් 183cm ක දක්ෂතාවයක් දක්වන ලද 4 (සෙව්) ශ්‍රීලංඉ ඒකකයට අයත් සෙ/බී100675 ඉසෙ රත්නායක ආර්එම්ටීඑස් දක්ෂතම පිටියේ ක්‍රීඩකයා ලෙස සම්මාන ලබා ගන්නා ලදී. එසේ ජයග්‍රහණයන් රැසක් සමගින් ඉංජිනේරු බළකාය තුල නව දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කරමින් 2018 අන්තර් ඒකක මලල ක්‍රීඩා තරඟාවලිය, ප්‍රධාන ආරාධිතයාගේ සමාප්ති ප්‍රකාශයෙන් අනතුරුව නිමාවට පත් විය.










# ඉංජිනේරු බළකා අන්තර් ඒකක කබඩි තරඟාවලිය - 2018

ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය තුල දක්ෂ ක්‍රීඩකයින්ගෙන් සමන්විත කබඩි කණ්ඩායමක් ස්ථාපිත කිරීමේ අරමුණින් අන්තර් ඒකක කබඩි තරඟාවලිය පහත සඳහන් ඒකකයන්හි සහභාගීත්වයෙන් යුතුව 2018.06.12, 13 සහ 14 යන දිනයන්හිදී පනාගොඩ ශාරීරික අභ්‍යාස පුහුණු පාසල් ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී.

1, 5, 6, 8, 9, 10, 12 කාඉරෙ ශ්‍රීලංඉ, 14 රණජීවීප්‍ර රෙජි ශ්‍රීලංඉ, 16 වැඩපල රෙජිමේන්තුව ශ්‍රීලංඉ සහ 4, 15 (සෙව්) ශ්‍රීලංඉ.

ඉහත ඒකක කන්ඩායම් අතුරින් වැඩිම ලකුණු ප්‍රමාණයක් ලබාගත් 6 කාඉරෙ ශ්‍රීලංඉ කබඩි කණ්ඩායම සහ 10 කාඉරෙ ශ්‍රීලංඉ කබඩි කණ්ඩායම අවසන් මහා තරඟය සඳහා සුදුසුකම් ලැබූ අතර, මෙහිදී 10 වන කාරක ඉංජිනේරු බළකා කණ්ඩායම පරාජය කරමින් **6 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තු කබඩි කණ්ඩායම** සමස්ථ තරඟාවලියේ ජය හිමිකර ගත් අතර, අනුශුරතාවය 10 වන කාරක ඉංජිනේරු බළකා කණ්ඩායම විසින් හිමි කරගන්නා ලදී.

ඒ අනුව ඉංජිනේරු බළකා අන්තර් ඒකක කබඩි තරඟාවලියේ සමාප්ති උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් බ්‍රිගේඩියර් එස්ටීබී දිසානායක ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් මෙම අවස්ථාව සඳහා සහභාගී විය.

# අන්තර් ඒකක වොලිබෝල් තරඟාවලිය - 2018

අන්තර් ඒකක වොලිබෝල් තරඟාවලිය මෙවර අති උත්කර්ෂවත් අන්දමින් 2018.07.30 වන දින සිට 2018.08.03 වන දින දක්වා 12 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තු වොලිබෝල් ක්‍රීඩාංගණයේදී පැවැත්වුනි. ඒ සඳහා ඉංජිනේරු බළකායට අයත් පහත සඳහන් ඒකකයන් විසින් කණ්ඩායම් සහභාගි වන ලදී.

1, 5, 6, 7, 8, 9, 10, 11 කාඉරෙ ශ්‍රීලංඉ, 14 රණජීවීප්‍ර රෙපි ශ්‍රීලංඉ, 16 වැඩපල රෙපිමේන්තුව ශ්‍රීලංඉ සහ 4, 15 (සේවි) ශ්‍රීලංඉ යන ඒකක අතුරින් කණ්ඩායම් සහභාගීවූ අතර, කුසපත් ඇදීමෙන් පසු එක් එක් කණ්ඩායම් පහත සඳහන් පරිදි ඒ හා බී වශයෙන් වෙන් කරන ලදී.

**ඒ කණ්ඩායම**
1, 5, 7, 8, 11 කාඉරෙ ශ්‍රීලංඉ, 14 රණජීවීප්‍ර රෙපි ශ්‍රීලංඉ සහ 16 වැඩපල රෙපිමේන්තුව ශ්‍රීලංඉ

**බී කණ්ඩායම**
6, 9, 10, 12 කාඉරෙ ශ්‍රීලංඉ සහ 4, 15 (සේවි) ශ්‍රීලංඉ

ඒ අනුව අවසාන තරඟය සමගින් තරඟ 37 කින් තරඟාවලිය සමන්විත වූ අතර මූලික වටයේ තරඟ ලීග් ක්‍රමයටත්, අවසාන පූර්ව වටය පිළිමලුන් පිටු දැකීමේ ක්‍රමයටත් පවත්වන ලදී. අවසාන පූර්ව වටය සඳහා ඒ කණ්ඩායමෙන් 1 කාඉරෙ ශ්‍රීලංඉ ඒකකය හා 14 රණජීවීප්‍ර රෙපි ශ්‍රීලංඉ ඒකකයද, බී කන්ඩායමෙන් 6 කාඉරෙ ශ්‍රීලංඉ ඒකකය හා 4 (සේවි) ශ්‍රීලංඉ ඒකකයද සුදුසුකම් ලබා ගත්හ. එම තරඟ පහත සඳහන් පරිදි සිදු කරන ලදී.

1 කාඉරෙ ශ්‍රීලංඉ - 6 කාඉරෙ ශ්‍රීලංඉ
14 රණජීවීප්‍ර රෙපි ශ්‍රීලංඉ - 4 (සේවි) ශ්‍රීලංඉ

1 කාඉරෙ ශ්‍රීලංඉ ඒකකය හා 14 රණජීවීප්‍ර රෙපි ශ්‍රීලංඉ ඒකකය අතර, තෙවන ස්ථානය සඳහා පවත්වන ලද තරඟයෙන් 1 කාඉරෙ ශ්‍රීලංඉ ඒකක කණ්ඩායම ජයග්‍රහනය කරන ලදී. තවද අවසාන මහා තරඟය තරඟ වට 05 කින් සමන්විත වු අතර, ඉන් තරඟ 03 ක් ජයග්‍රහණය කර 2018 වර්ෂයේ අන්තර් ඒකක වොලිබෝල් තරඟාවලිය 4 (සේවි) ශ්‍රීලංඉ ඒකකය විසින් ශූරතාවය ලබා ගන්නා ලදී. තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා, දක්ෂතම පන්දු ඔසවන්නා හා දක්ෂතම පහර දෙන්නා ලෙස පහත නම් සඳහන් නිලධාරී/සෙනීන් විසින් ලබා ගන්නා ලදී.

**දක්ෂතම ක්‍රීඩකයා** - සෙ/බී101338 ඉසෙ දේවින්ද ඩීඑච්එස්
**දක්ෂතම පනදු ඔසවන්නා** - නි/10621 ලුතිනන් කේඑම් තෙන්නකෝන් ශ්‍රීලංඉ
**දක්ෂතම පහර දෙන්නා** - සෙ/239679 කෝප්‍රල් හේරත් එච්එම්

තවද මෙම තරඟාවලියේ විශේෂ දක්ෂතා දැක්වූ ක්‍රීඩකයින් හට ජය සංකේත සහ කුසලාන පිරි නැමීම සඳහා ලුතිනන් කර්නල් ඩීඑන්සී සේරසිංහ ආර්එස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් සහභාගී විය.






# අන්තර් ඒකක සැහැල්ලු පන්දු (ටී - 20) ක්‍රිකට් තරඟාවලිය - 2018

2018 වර්ෂය සඳහා ඉංජිනේරු බළකායට අයත් සියළු ඒකක නියෝජනය කරමින් අන්තර් ඒකක සැහැල්ලු පන්දු (ටී 20) ක්‍රිකට් තරඟාවලිය මත්තේගොඩ සැපර් ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී. එහිදී මූලික වටයේ තරඟ 2018 ඔක්තෝබර් මස 08,09,10 සහ 11 යන දිනයන්හිදී කණ්ඩායම් 16 ක් කාණ්ඩ හතරක් යටතේ ඒ/බී/සී සහ ඩී යනුවෙන් තරඟ වදින ලදී.

**ඒ කාණ්ඩය** - 7, 9 කාඉරෙ ශ්‍රීලංඉ, 16 වැඩපල රෙජිමේන්තුව ශ්‍රීලංඉ, 4 (සෙවි) ශ්‍රීලංඉ
**බී කාණ්ඩය** - 1, 5, 6 කාඉරෙ ශ්‍රීලංඉ, රෙජිමුබ ශ්‍රීලංඉබ
**සී කාණ්ඩය** - 8, 12 කාඉරෙ ශ්‍රීලංඉ, 14 රණජීවිප්‍ර රෙජි ශ්‍රීලංඉ, 15 (සෙවි) ශ්‍රීලංඉ
**ඩී කාණ්ඩය** - 10, 11 කාඉරෙ ශ්‍රීලංඉ, ශ්‍රීලයුඉපා

ඒ අනුව අන්තර් ඒකක සැහැල්ලු පන්දු (ටී 20) ක්‍රිකට් තරඟාවලියේ අවසන් මහ තරඟය 8 කාඉරෙ ශ්‍රීලංඉ සහ 9 කාඉරෙ ශ්‍රීලංඉ කන්ඩායම් අතර, 2018 ඔක්තෝබර් මස 27 වන දින පවත්වන ලදී. මෙහිදී 9 කාඉරෙ ශ්‍රීලංඉ කණ්ඩායම පරාජයට පත් කරමින් 2018 වර්ෂයේ අන්තර් ඒකක සැහැල්ලු පන්දු (ටී 20) ක්‍රිකට් තරඟාවලියේ ශූරතාවය දිනා ගැනීමට 8 කාඉරෙ ශ්‍රීලංඉ ක්‍රිකට් කණ්ඩායම සමත් වන ලදී.

ඉන් අනතුරුව ජය සංකේත ප්‍රධානෝත්සවයේ දී මෙවර තරඟාවලියේ කැපී පෙනෙන දක්ෂතාවයන් පෙන්වන ලද කණ්ඩායම් වලට සහ තරඟ කරුවන් හට කුසලාන සහ සහතික පත් පිරිනමමින් ඉතා උත්කර්ෂවත් අන්දමින් 2018 වර්ෂයේ අන්තර් ඒක සැහැල්ලු පන්දු (ටී 20) ක්‍රිකට් තරඟාවලිය සමාප්ත වන ලදී.

**ශූරතාවය** - 8 කාඉරෙ ශ්‍රීලංඉ
**අනුශූරතාවය** - 9 කාඉරෙ ශ්‍රීලංඉ
**තරඟාවලියේ වීරයා** - සෙ/245927 ලා/කෝ ඒකනායක ඊඑම්එස්කේ - 9 කාඉරෙ ශ්‍රීලංඉ
**දක්ෂතම පිතිකරු** - සෙ/245927 ලා/කෝ ඒකනායක ඊඑම්එස්කේ - 9 කාඉරෙ ශ්‍රීලංඉ
**දක්ෂතම පන්දු යවන්නා** - සෙ/247766 ඉසෙ තරංග පීසී - 8 කාඉරෙ ශ්‍රීලංඉ
**දක්ෂතම පන්දු රකින්නා** - සෙ/241093 කෝප්‍රල් ජනක කුමාර එම්ජී - 8 කාඉරෙ ශ්‍රීලංඉ
**අවසන් මහා තරඟයේ වීරයා** - සෙ/241093 කෝප්‍රල් ජනක කුමාර එම්ජී - 8 කාඉරෙ ශ්‍රීලංඉ



# අන්තර් රෙජිමේන්තු කරාතේ තරඟාවලිය - 2018

යුධ හමුදා අන්තර් රෙජිමේන්තු කරාතේ තරඟාවලිය 2018 දෙසැම්බර් 27 වන දින සිට 2018 දෙසැම්බර් 29 වන දින දක්වා යුධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල - පනාගොඩ ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්වූ අතර, එම තරඟාවලියේදී ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය නියෝජනය කරමින් කරාතේ සංචිතයට අයත් පහත නම් සඳහන් ක්‍රීඩකයින් ජයග්‍රහණයන් අත්පත් කරගෙන ඇත.

**ාතා තරඟ ඉසව්වේ කලු පටි අංශයේ රන් පදක්කම**
සෙ/243908 ලාන්ස් කෝප්‍රල් දයානන්ද ටීපීටීසී

**කණ්ඩායම් කාතා තරඟ ඉසව්වේ කලු පටි අංශයේ රන් පදක්කම**
සෙ/243908 ලාන්ස් කෝප්‍රල් දයානන්ද ටීපීටීසී
සෙ/ඕ101273 ඉංජිනේරු සෙබල රාජසිංහ ආර්එම්එන්එස්එස්
සෙ/ඕ100042 ඉංජිනේරු සෙබල සුරේෂ් නිලංග එච්ඒ



**කිලෝග්‍රෑම් 50 කුම්තේ තරඟ ඉසව්වේ - කලු පටි අංශයේ රන් පදක්කම**
සෙ/ඕ101273 ඉංජිනේරු සෙබල රාජසිංහ ආර්එම්එන්එස්එස්

**කිලෝග්‍රෑම් 60 කුම්තේ තරඟ ඉසව්වේ - කලු පටි අංශයේ රන් පදක්කම**
සෙ/248390 ලාන්ස් කෝප්‍රල් ෆොන්සේකා ඩබ්ලිව්ආර්එස්

**කිලෝග්‍රෑම් 70 කුම්තේ තරඟ ඉසව්වේ - කලු පටි අංශයේ රන් පදක්කම**
සෙ/248391 ලාන්ස් කෝප්‍රල් සිල්වා එෆ්එච්කේඑල්

**කිලෝග්‍රෑම් 70 කුම්තේ තරඟ ඉසව්වේ දුඹුරු පටි අංශයේ රන් පදක්කම**
සෙ/244539 ලාන්ස් කෝප්‍රල් කුමාරතුංග ජේඑම්එස්

**කිලෝග්‍රෑම් 55 කුම්තේ තරඟ ඉසව්වේ දුඹුරු පටි අංශයේ රන් පදක්කම**
සෙ/ඕ100674 ඉංජිනේරු සෙබල අබේරත්න ආර්ආර්එන්

**කලු පටි අංශයේ දක්ෂතම ක්‍රීඩකයා**
සෙ/ඕ101273 ඉංජිනේරු සෙබල රාජසිංහ ආර්එම්එන්එස්එස්

**අවසාන වශයෙන් සමස්ථ තරඟාවලියේම කලුපටි අංශයේ ශූරතාවය ඉංජිනේරු බලකා කරාතේ කණ්ඩායම විසින් දිනා ගන්නා ලදී.**

# SAPPERS EMERGED CHAMPIONS IN THE ARMY GOLF TOURNAMENT - 2018

Sri Lanka Army Golf Association organized the Inter Regiment Golf Tournament which was worked off on 8th and 9th February 2019 at the picturesque Golf Course (Polo Ground), in Diyatalawa.

The inter regiment golf tournament was worked out in the main two categories of 'team' and 'individual'. Individual events were conducted as per the age categories. In this tournament more than 100 male and female competitors represented most of the regiments.

Sappers gave a tough resistance to their opponents throughout the tournament and clinched the championship. Further, Colonel Lanka Amarapala, presently serving as the Commander 593 Brigade, won Bronze medal securing third place in the over 40 category, Lance Corporal Ajith Kumara secured second place and Lance Corporal Keerthisinghe secured third place in the open events.

Major General Rukmal Dias, Commandant Sri Lanka Army Volunteer Force, graced the occasion as the chief guest. Major General Nirmal Darmarathne – Chief of Staff - Office of Chief of Defence Staff, Brigadier N Haturusinghe – Chairmen, Army Golf Association and Brigadier Shantha Eshwaran - Commandant Sri Lanka Military Academy along with many other Senior Officers, Officers and Other Ranks participated in the presentation ceremony.




Sappers Team:

1. Colonel Lanka Amarapala RWP RSP psc, 2. Lance Corporal Ajith Kumara LM, 3. Lance Corporal Keerthisinghe TM, 4. Sapper Ilangarathna KS, 5. Sapper Silva PM, 6. Sapper Meegasthanna MWM.

# THE OFFROAD CHALLENGE






Organized by the
Corps of Sri Lanka Engineers

In collaboration with the
Four Wheel Drive Club

In collaboration with the
Sri Lanka Motorcycle Riders Association

The Corps of Sri Lanka Engineers steered Sappers 4 X 4 Gympo 2019 off-road challenge collaborated with the Four Wheel Drive Club (FWDC) and the Sri Lanka Motorcycle Riders' Association (SLMRC) took part in the ninth consecutive year on 08 September 2019 at the Sapper off-Road Arena, Embilipitiya. Major General H J S Gunawardena RSP VSV USP ndc psc, the Colonel Commandant, Corps of Sri Lanka Engineers and the Commander, Security Forces Headquarters (Wanni) honoured the event as the chief guest.

SAPPERS 4x4
GYMPO 2019
LEVEL 9

The Sappers are no strangers when it comes to track construction, where as other speed tracks in the Sri Lanka are testimonies of the accomplishments. Further, the Military Engineers have been instrumental in renovating roads in the post - war Sri Lanka. With the expert knowledge and experience of over the years, the Sappers with the technical advice of the FWDC has incorporated the picturesque elements hills and valleys of Sri Lanka into a 4 X 4 track which is unique to Tunkama, Embilipitiya. The chosen Logo depicts the words Sappers 4 X 4 with the black and white checkered flag to indicate the off road motor rally. The Bison with wheels shows the rugged and tough going of the competitors with the word Gympo which the unique name was given to this Bison.

The Sapper Off Road Arena at Sri Lanka School of Military Engineering (SLSME), Embilipitiya, is constructed with obstacles in such a manner that natural obstacles are emulated and both the drivers and navigators are tested on their extreme adaptive skills. The uniqueness of the track lies in the variation of obstacles as teams have to drive through mud pits, water crossing, and crossing of log bridges, rock climbing, V grooved trails in different stages of the same track. The key feature is the over and under track where a two lane track in the shape of number eight cross at the center via a compact 200 extra wide bridge with tracks that only accommodate the width of the vehicles. Along the track there are various obstacles, mostly uneven articulation which test the teams coping with the forces of gravity.

Each team gets a run on both lanes back to back which is going through the obstacles. The event have five categories, the standard vehicles, standard modified, under 3000 cc, Over 3000 cc and Extreme Class which were battled out among top teams of Sri Lanka and the foreign teams which have shipped their vehicles to contest this title.









The Off road challenge followed by following events.

**4x4 Events**

- Touring Class 4X4 OVERALL
- Touring Class Standard 4X4
- Touring Class Modified 4X4



**Motorcycle Events**

- Group MX - Over 100cc up to 125cc 2T - 4 Laps
- Group J MX 85cc - Over 9 years up to 12 years - 4 Laps
- Group M Street Trial over 100cc up to 125cc 2T - 4 Laps
- Group MX including 125cc 2T up to 250cc 4T - Race 01 - 10 Laps
- Group J MX 65cc Over 9 years up to 12 Years - 3 Laps
- Group M Street Trail Over 100cc up to 125cc 2T & 175cc up to 250cc 4T Race 01 - 7 Laps
- Group J MX 85cc Under 15 Years - Race 01 - 7 Laps
- Group J MX 50cc - Over 5 years to 10 Years - 3 Laps
- Group M street trail over 100cc up to 125cc 2T & 175cc up to 250cc 4T - Race 02 - 8 Laps
- Group 1 MX 85cc Under 15 years - Race 02 - 8 Laps
- Group MX Including 125cc 2T up to 250cc 4T - Race 02 - 12 Laps


Red Bull
WURTH
65 - 1955
PRADO
CEAT
KTM
162
102

# COMMANDING OFFICERS
# CORPS OF SRI LANKA ENGINEERS



Major RT
Ganegoda SLE
1 Field SLE



Major DG
Thilakaratne RSP SLE
5 Field SLE



Major GGCL
Kulathunga RSP psc SLE
6 Fied SLE



Major SK
Warahena SLE
7 Field SLE



Major PGPA
Wijeratne RSP SLE
8 Field SLE



Major GAD
Alwis RSP psc SLE
9 Field SLE



Major PADSW
Ponnamperuma psc SLE
10 Field SLE



Lt Col JACS
Jagoda psc SLE
11 Field SLE



Major GJP
De Silva SLE
12 Field SLE



Major MDJ
Wickramaarachchi USP psc SLE
14 CBRN SLE



Major KADP
Sugathadasa USP SLE
16 WKSP SLE



Major TMP
Jalal SLE
4 (V) SLE



Major ELKR
Edirisinghe SLE
15 (V) SLE



Colonel MPK
Madurapperuma RSP USP psc
SLSME

# රෙජිමේන්තු සැරයන් මේජර් වරුන්
# ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය



බනි 1 ටීඩීආර්
රුවන් කුමාර
1 කාඉරෙ



බනි 1 එච්යූඑස්
රත්නායක
5 කාඉරෙ



බනි 1 ඒඑම්
රත්නායක
6 කාඉරෙ



බනි 1 ඒපීටී
රාජපක්ෂ
7 කාඉරෙ



බනි 1 පීඑම්ඩබ්එම්යූ
කුමාරසිංහ
8 කාඉරෙ



බනි 1 කේඑම්
වීරරත්න
9 කාඉරෙ



බනි 1 එස්ඒඑස්
උදයකුමාර
10 කාඉරෙ



බනි 1 එච්ආර්පී
ජයසූරිය
11 කාඉරෙ



බනි 1 ඩීඑම්ජේ
දිසානායක
12 කාඉරෙ



බනි 1 එච්එම්
ධර්මදාස
14 රණජීවීප්‍ර ශ්‍රීලංඉ



බනි 1 කේබී
සටීපත් පියසිරි
16 වැඩපල ශ්‍රීලංඉ



බනි 1 යූඒ
වීරසිංහ
4(සෙව්) ශ්‍රීලංඉ



බනි 1 එම්එම්
අමරසිංහ
15 (සව්) ශ්‍රීලංඉ



බනි 1 එම්එස්ඒඑස්පී
විජේවික්‍රම
ශ්‍රීලයුඉපා

# ඉංජිනේරු බළසේනා මූලස්ථානය

ඉංජිනේරු බළසේනා මූලස්ථානයේ නවතමයෙන් ආරම්භ කරන ලද ඔසු උයන 2019.07.11 වන දින මෙම බළකා කර්නල් සේනාවිධායක හා බළසේනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.





ඉංජිනේරු බළසේනා මූලස්ථානයේ අලුත්වැඩියා කරන ලද නිලධාරී භෝජනාගාරය 2019.07.11 වන දින ආසේමු (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ජගත් ගුණවර්ධන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.





ඉංජිනේරු බළසේනා මූලස්ථානයේ අලුත්වැඩියා කරන ලද සිවිල් සේවක මහතුන්ගේ භට නිවාසය 2019.09.16 වන දින ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් තිස්ස නානායක්කාර ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.





# 1 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව

**සිරිසර පිවිසුම – ත්‍රිකුණාමල දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන.**

ජනවාර්ගික වශයෙන් සිංහල, ද්‍රවිඩ හා මුස්ලිම් යන ජන වර්ග තුනම ජීවත්වන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ විශාලත්වය හෙක්ටයාර් 228,000 කි. එයට කුඹුරු ඉඩම් හෙක්ටයාර් 44,000 ක්, ආසියාවේ විශාලතම ස්වභාවික වරාය, සංචාරක ආකර්ශනීය වෙරළ තීරයක් ඇතුලු සම්පත් විශාල ප්‍රමාණයක් අයත් වේ. මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කින් හා ග්‍රාම නිලධාරී කොට්ඨාශ 230 කින් සමන්විත වේ. වසර 30 කට ආසන්න කාලයක් පැවති යුධමය තත්වයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජීවත්වන සියලුම ජනතාව දැඩි පීඩාවකට ලක්වූ අතර, යටිතල පහසුකම් සංවර්ධනය අතින් ඉතාම දුර්වල තත්වයක පවතියි. වර්ථමාන ප්‍රජා අවශ්‍යතාවයන්ට








සරිලන අයුරින් එම පහසුකම් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව නොපවතින අතර ඒ හේතුවෙන් දිස්ත්‍රික්කයේ ජීවත්වන ප්‍රජාව දිලිඳුකමින් පීඩා විඳී. එමෙන්ම එම ජනතාවගෙන් වැඩි පිරිසක් ගොවීන් වන අතර ග්‍රාමීය මාර්ග, වාරිමාර්ග වැනි යටිතල පහසුකම්වල පවතින දුර්වලතාවය හේතුවෙන් එම ප්‍රජාවගේ ජීවන තත්වය ඉහල නැංවීම බාධාවක්ව පවතී. එබැවින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජන ජීවිතය ඉහල නැංවීමට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වලට ප්‍රමුඛතාවයක් ලබාදීමේ දැඩි අවශ්‍යතාවය මත වැව් හා මාර්ග සංවර්ධනය කිරීමේ උදාරතර කර්තව්‍ය මෙම ඒකකය විසින් සිදුකරමින් පවතියි.

# 5 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව

**පිදුරුතලාගල සමරුඑලකය ප්‍රතිසංස්කරණය කිරීම.**

1987.04.04 වන දින පළමුවන යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ අණදෙන නිළධාරීගේ මගපෙන්වීම යටතේ සෙසුනිලයින් විසින් 1987 වර්ෂයේ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර, 1989 අගෝස්තු මස 23 වන දින පළමුවන යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව 5 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව ශ්‍රීලංඉ ලෙස නම් කිරීමෙන් පසු 1990 ජනවාරි මස 31 වන දින ව්‍යාපෘතියේ වැඩ කටයුතු නිමාකොට මෙම මාර්ගය විවෘත කරන ලදී.





සොබා සෞන්දර්යයෙන් පිරුණු ශ්‍රී ලංකාවේ උසම ස්ථානය වෙත පිවිසීම සඳහා කිලෝමීටර 6.2 පමණ දුරකින් යුත් මෙම මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන්, දුෂ්කර දේශගුණික තත්වයන් යටතේ, සංවේදී පාරිසරික භූමි ප්‍රදේශයක් තුළ වුවද දායකවූ සියලුම නිළධාරින්ගේ නිවැරදි මග පෙන්වීම යටතේ සෙසුනිළයින්ගේ අප්‍රතිහත ධෛර්යයේ හා කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස පරිසර හානිය ඉතාමත් අවම මට්ටමක පවත්වා ගනිමින් සාර්ථකව නිමා කිරීමට හැකිවිය. කාලයාගේ ඇවෑමෙන් ගරා වැටෙමින් තිබූ මෙම සමරුඑලකය 5 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ අණදෙන නිළධාරීගේ අධීක්ෂණයෙන් සහ සෙසුනිලයින් විසින් ප්‍රතිසංස්කරණය කෙරෙණි.

2019 අගෝස්තු මස 12 දින මෙම මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ පුරෝගාමියෙකු ලෙස එවකට පළමුවන යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ යාන්ත්‍රික බළඝණ භාර නිළධාරි අණදෙන ලෙස කටයුතු කළ 22 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එන් යූ එම් එම් ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී යුඑස්ඩබ්ලිව්සීජීඑස්සී විසින් විවෘත කරන ලදී.







# 6 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව

**6 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව නවතමයෙන් මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ ස්ථානගත වන ලදී.**

6 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව නවතමයෙන් ආසේමු(මධ්‍යම) බල ප්‍රදේශය තුල මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ 2019.02.25 වන දින සිට ස්ථානගතවූ අතර, ව්‍යාපෘති රාජකාරීන්/ජාතික සංවර්ධන ව්‍යාපෘති රාජකාරීන් හා ඉංජිනේරු රාජකාරීන් ඉටු කරන අතරතුර ඒකකය සඳහා ඇවැසි ගොඩනැගිලි හා කඳවුර සඳහා අවශ්‍ය අනෙකුත් අවශ්‍යතාවයන් ඉටු කරගනු ලබයි.





2019.04.29 වන දින අණදෙන නිළධාරී විසින් කඳවුරු භූමියෙහි ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා මුල්ගල තැබීම සහ ඉදි කරමින් පවතින නව මුරහල.





සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය සඳහා නවතමයෙන් ඉදිකරනලද සෙසුනිල භට නිවාසය හා බනි සැරයන් නිවස්නය අණදෙන නිළධාරී විසින් විවෘත කිරීම.

ආසේමු(මධ්‍යම) බලප්‍රදේශයතුල යුධ හමුදා ව්‍යාපෘති හා සිවිල් ව්‍යාපෘති මෙන්ම ගම්පෙරලිය ව්‍යාපෘතිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කය තුල ජාතික සංවර්ධන ව්‍යාපෘතීන්ද ඉටු කරනු ලබයි.



ගම්පෙරලිය ව්‍යාපෘතිය යටතේ මොණරාගල, සියඹලාණ්ඩුව ප්‍රදේශයේ මීයකෙටු ආර වැව ප්‍රතිසංස්කරණය කිරීමේ රාජකාරීන් 2019.01.08 වන දින සහ වතුර ආර වැව ප්‍රතිසංස්කරණය 2019.05.11 වන දින මෙම ඒකක අධික්ෂණය යටතේ ආරම්භ කර ඇත.



ගම්පෙරලිය ව්‍යාපෘතිය යටතේ මොණරාගල දිස්ත්‍රික් තරුණ තරුණියන්ගේ ක්‍රීඩා දක්ෂතාවයන් වැඩිදියුණු කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය හා මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි මඟපෙන්වීම යටතේ මෙම ඒකක අධීක්ෂණය තුලින් 2019.09.16 දින ආරම්භ කරන ලද මොණරාගල ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘති රාජකාරී සිදු කිරීම.



මීට අමතරව යුද්ධ හමුදා ව්‍යාපෘති අතුරින් ප්‍රසැවෙපුපා කඳවුර තුල නවතමයෙන් මීටර් 500 ක දිගකින් යුත් වෙඩිපිටියක් සැකසීමේ ව්‍යපෘතිය ඉටු කරනු ලබයි.







# 7 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව



අතිගරු ජනාධිපති තුමන්ගේ සංකල්පයකට අනුව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ගම්පෙරලිය ව්‍යාපෘතිය - 2018 වැඩසටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දැලිව ගම්මානයේ පිහිටි කොස්ගස්අරාව වැව ප්‍රතිසංස්කරණය කිරීම 2018.09.07 වන දින මෙම ඒකකය වෙතින් ආරම්භකර 2019.08.24 දින අවසන් කරන ලදී.



## නව අණදෙන නිලධාරී වැඩ භාර ගැනීම

7 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ 15 වන අණදෙන නිළධාරී වශයෙන් නි/64731 මේජර් එස්කේ වරාහේන යුඑස්පී ශ්‍රිලංඉ ජ්‍යෙෂ්ඨ නිළධාරී 2019 සැප්තැම්බර් මස 04 වන දිනට යෙදුනු සුභ මොහොතින් සිය රාජකාරි අරඹණ ලදී.

7 කාඉරෙ ශ්‍රීලංඉ වෙතින් සිදු කරගෙන යනු ලබන ජාතික සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් පොළොන්නරුව ගල් විහාරය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යුද හමුදා සෙබලුන් සහ යුද හමුදා යන්ත්‍ර/ වාහන යොදවාගෙන සිදු කරනු ලබයි. පොළොන්නරුව ගල් විහාරයෙහි තිවංක පිළිම ගෙයට පිවිසෙන මාර්ග යේ අලුත් වැඩියා කටයුතු මේ වන විට අවසන් කර ඇත.

එමෙන්ම පිබිදෙමු පොලොන්නරුව ජාතික සංවර්ධන ව්‍යාපෘතියට ඒකකය විසින් විශාල දායකත්වයක් ලබා දෙනු ලබයි.



2019.04.21 දින අන්තවාදී ත්‍රස්ථවාදී කණ්ඩායමක් විසින් සිදුකළ පාස්කු ඉරුදින ප්‍රහාරය හේතුවෙන් මෙම ඒකකය ස්ථාපිත ආසේමු (නැ) බළප්‍රදේශයේ ආරක්‍ෂාවට විශාල බළපෑමක් සිදුවිය. ඒ අනුව මෙම ඒකකය ආසේමු (නැ) බළප්‍රදේශය ආවරණය වන පරිදි විශේෂ සෝදිසි මෙහෙයුම් හා බෝම්බ නිශ්ක්‍රිය කණ්ඩායම් යොදවමින් ත්‍රස්ථවාදීන් විසින් පරිහරණය කරන ලද පුපුරණ ද්‍රව්‍ය, අවි ආයුධ හා අනෙකුත් උපකරණ විශාල ප්‍රමාණයක් සයින්තමරුතු හා සමන්තුරෙයි යන ප්‍රදේශයන් වලින් සොයා ගන්නා ලදී. තවද මෙම තත්වය මත ආසේමු (නැ) බළප්‍රදේශය ආවරණය වන පරිදි හදිසි සෝදිසි මෙහෙයුම් හා මාර්ග බාධක යොදවමින් රටතුල සාමය හා ආරක්‍ෂාව ස්ථාපිත කිරීම සඳහා මෙම ඒකකය විසින් විශාල කාර්‍යයභාරයක් ඉටු කරන ලදී.







# 8 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව

**8 කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ 15 වන අණදෙන නිලධාරී මේජර් පීජීපීඑ් විජේරත්න ආර්එස්පී යූඑස්පී ශ්‍රීලංඉ සිය ධුරයෙහි වැඩ ආරම්භ කරන ලදී.**





**ගුවන් සංග්‍රාමික පුහුණු පාසල නිකවැව කඳවුරෙහි සරඹ පිටිය සහ මාර්ග පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය.**

ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර.





ව්‍යාපෘතිය වැඩ අවසන් කිරීමෙන් පසු.





**පානු පතුරම් / වෙඩි ද්‍රව්‍ය විනාශ කිරීම.**

ආරක්‍ෂක සේනා මුලස්ථානය (වන්නි) බලප්‍රදේශය තුල ස්ථාපිත ප්‍රාදේශීය යුධෝපකරණ ගබඩා සංකීර්ණය (ගජසිංහපුර) ගබඩා කර තිබූ පාවිච්චියට නුසුදුසු අධි අන්තරාදායී කාලතුවක්කු පතුරම් හා මෝටාර් බෝම්බ අම්පකාමන් ප්‍රදේශයේ වෙඩි පිටියේදී විනාශ කිරීම.





# 9 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව

### නව අණදෙන නිළධාරීතුමන් වැඩ භාර ගැනීම





9 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ 13 වන අණදෙන නිළධාරී වශයෙන් මේජර් පීඩබ්ඩී අල්විස් ආර්එස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් 2019.09.04 වන දින සිය රාජකාරී අරඹමින්.









ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් ටීජේ නානායක්කාර ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩියු යන ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් 2019.09.17 වන දින 9 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව කොකාවිල්හි කඳවුරු සංචාරයට සහභාගී වෙමින්.









9 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවෙහි නිළධාරීන් සහ සෙනීන් විසින් හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීපීඑස්සී පීඑස්සී හට 2019.07.27 වන දින ආසේමු (කිළි) සංචාරයේදී කඳවුරු මුරයක් සහ සම්මාන මුරයක් පැවැත්වීම.





70 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව 2019.10.10 වන දින 9 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තු සෙනීන්ගේ ශ්‍රම දායකත්වයෙන් කිළිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල් භූමිය පිරිසිදු කිරීම.







661 බළසේනා මූලස්ථානය යටතේ වන පුනරීන් ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ ප්‍රයෝජනය සඳහා කවායිලම් වැව ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.

# 10 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව

10 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව වර්ෂ 2007ක් වූ අගෝස්තු මස 03 වන දින යාපනය ආරක්ෂක සේනා මුලස්ථානය යටතේ 513 බලසේනා මුලස්ථානයට අනියුක්තව මේජර් ඩබ්ලිව්ආර්ඒච්කේ විජේසුන්දර ශ්‍රිලංඉ (එවකට) ප්‍රධානත්වයෙන් මයිලඩි - කන්කසන්තුරයහිදී ස්ථාපිත කරන ලදි.



මෙම ඒකකය වෙතින් යාපනය අර්ධද්වීපයේ සිවිල් ජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අතර, විශේෂයෙන් යාපනය අර්ධද්වීපය තුල මානුෂවාදී බිම් වෙඩි ඉවත් කිරීමේ රාජකාරි සහ ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරි කරනු ලබන එකම ඒකකය මෙම ඒකකය වේ. 2019 වර්ෂය තුලදී මෙම ඒකකය වෙතින් සිදුකරන ලද ව්‍යාපෘති /විශේෂ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

නිළධාරි/සෙසුනිළයින්ගේ ඒකාකාරි ජීවන රටාව වෙනස් කිරීමේ අදිටනින් සියලුම අයවලුන්ගේ රසාස්වාදය සඳහා එලිමහන් සිනමා ශාලාවක් තැනීම.








10 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ රාජකාරි කරනු ලබන නිලධාරි/සෙසුනිලයින්ගේ හා ධානපතියන්ගේ ආධාරයෙන් ඒකක නිළධාරි සහ සෙසුනිලයින්ගේ ආධ්‍යාත්මික සුවය සහ පහන් සිත් ජනිත කිරීමේ අරමුණින් නව බුදු මැදුරක් ඉදි කල අතර එම බුද්ධ මන්දිරය ඒකක අණදෙන නිලධාරි මේජර් වරුණ පොන්නම්පෙරුම ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ ආරාධනයෙන්, ආරක්‍ෂක සේනා ආඥාපති (යාපනය) මේජර් ජෙනරාල් රුවන් වනිග සූරිය ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් වර්ෂ 2019 ක්වූ අගෝස්තු 09 වන දින සුභ මොහොතින් විවෘත කරන ලදී.



ඒකක අණදෙන නිලධාරි තුමන්ගේ සංකල්පයක් මත ඒකකයට නව මුහුණුවරක් එක් කරමින් 10 වන කාරක රෙජිමේන්තුවේ මුලස්ථාන ගොඩනැගිල්ල ඉදිරිපිට ජාතික ධජය, ඉංජිනේරු ධජය සහ ඒකක ධජය එසවීම සඳහා ඉදිකර ඇති ස්ථානය, ඒකකයේ නම සහ ඉංජිනේරු බලකා ලාංඡනය ඇතුලත් කර ඉතාමත් සිත් ඇදගන්නාසුළු ආකාරයට නවීකරණය කිරීම.

# 11 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව





## නව අණදෙන නිළධාරී වැඩභාර ගැනීම.

11 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ 6 වන අණදෙන නිළධාරී ලෙස මේජර් ජේ ඒ සී එස් ජාගොඩ පීඑස්සී ශ්‍රීලංඉ විසින් 2019.07.02 වන දිනට යෙදුණු සුභ මොහොතින් සිය රාජකාරී භාරගනිමින්.

අතිගරු ජනාධිපති තුමන්ගේ සංකල්පයක් මත ක්‍රියාත්මක ග්‍රාමශක්ති ව්‍යාපෘතිය යටතේ 11 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව විසින්

- ඉහල මිල්ලගොල්ලෑව වැව
- මහ මිල්ලගොල්ලෑව වැව
- ඉහල ඇතා වැව
- දුණුමඩලාව වැව
- නබඩගස්දිගිලිය වැව
- ගලහිටියාව වැව
- හැලඹ වැව

කටයුතු ආරම්භ කර මේ වන විට සිදුකරමින් පවතී.

## දුණුමඩලාව එල්ලංගා පද්ධතිය ප්‍රතිසංස්කරණ කටයුතු.









## ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු සංචාරය.

ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් ටී ජේ නානායක්කාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු විසින් වැඩ භාර ගැනීමෙන් පසු සිදුකරනු ලැබූ ප්‍රථම ඒකක සංචාරය සඳහා 11 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව තෝරා ගන්නා ලද අතර එහිදී 2019.09.15 වන දින ක්ෂේත්‍ර නිරීක්ෂණය සිදු කල අතර 2019.09.16 වන දින ඒකකයේ සංචාරය කරන ලදී.







## මිහින්තලය බුලංකුලම වැව ප්‍රතිසංස්කරණය කිරීම.

මිහින්තලේ රජමහා විහාරාධිපති විසින් අතිගරු ජනාධිපති තුමන් වෙතින් සිදුකරනු ලබන ඉල්ලීමකට අනුව 11 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව විසින් 2019.03.18 වන දින මිහින්තලය බුලංකුලම වැව ප්‍රතිසංස්කරන කටයුතු ආරම්භ කර මේ වන විට සිදුකරමින් පවතී.





# 12 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව

## 11 වන සංවත්සරය සැමරීම.

12 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව 11වන සංවත්සරයට සමගාමීව ඒකක අණදෙන නිලධාරී තුමන් වන මේජර් ජී ජේ පී ද සිල්වා ශ්‍රීලංඉ ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් හට කඳවුරු සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් රෙම ශ්‍රිලංඉබ සරඹ භුමියේදී 2019.02.06 වන දින පිරිනමන ලදී.







## මීතොටමුල්ල සංවර්ධන ව්‍යාපෘතිය.

මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයේ අදහසකට අනුව නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) හා ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ සංවර්ධන සංවිධානය (NBRO) අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත භාරදෙනු ලැබූ මීතොටමුල්ල කසල කන්ද ආශ්‍රිතව මීතොට හරිත උද්‍යානය ඉදිරිකිරීමේ කටයුතු හා සංවර්ධන ව්‍යාපෘතියේ රාජකාරි 2018.08.13 වන දින ආරම්භ කර මේ වන විට 12 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ භට පිරිස් හා යන්ත්‍ර සූත්‍ර යොදවා සිදු කරමින් පවතී.











## මධ්‍යස්ථාන සේනාවිධායක තුමාගේ කඳවුරු සංචාරය.

ඉංජිනේරු බලකා වත්මන් මධ්‍යස්ථාන සේනාවිධායක තුමන් වන බ්‍රිගේඩියර් රවීන්ද්‍ර ඩයස් ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් නව තනතුර භාරගැනීම නිමිතිකොට ගෙන 2019.06.06 වන 12 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තු කඳවුරු සංචාරය.







## ක්‍රීඩා ජයග්‍රහණ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු යතුරුපැදි තරඟාවලිය - 2019 වර්ෂය වෙනුවෙන් ප්‍රථම වරට ඉංජිනේරු බළකාය නියෝජනය කරමින් 2019.03.02 වන දින ගජබා ධාවන පථයේ පැවැති ආධුනික යතුරුපැදි 125 සීසී ඉසව්වට සහභාගී වෙමින් සෙ/247161 ඉංජිනේරු සෙබල දේශප්‍රිය ඊඑම්එස් යන සෙබළා දෙවන ස්ථානය දිනාගන්නා ලදී.







# 14 රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලී සහ න්‍යෂ්ටික ප්‍රතිචාර රෙජිමේන්තුව ශ්‍රීලංඉ

**14 රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලී සහ න්‍යෂ්ටික ප්‍රතිචාර රෙජිමේන්තුව ශ්‍රීලංඉ ඒකකයේ අණදෙන නිළධාරී වැඩ භාරගන්නා අවස්ථාව**.






14 රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලී සහ න්‍යෂ්ටික ප්‍රතිචාර රෙජිමේන්තුව ශ්‍රිලංඉ 7 වන අණදෙන නිළධාරී වශයෙන් නි/64618 මේජර් එම්ඩීජේ වික්‍රමආරච්චි යූඑස්පී පීඑස්සී ශ්‍රීලංඉ 2019.09.11 වන දින අභිනවයෙන් තනතුරේ රාජකාරි භාරගන්නා ලදී.

**14 රසායනික ජීව විද්‍යාත්මක විකිරණශිලි සහ න්‍යෂ්ඨික ප්‍රතිචාර රෙජිමේන්තුව ශ්‍රිලංඉ ඒකකයේ දෙවන අණ-දෙන නිළධාරි වැඩ භාරගන්නා අවස්ථාව.**



14 රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලී සහ න්‍යෂ්ටික ප්‍රතිචාර රෙජිමේන්තුව ශ්‍රිලංඉ 11 වන දෙවන අණදෙන නිළධාරී වශයෙන් නි/65165 මේජර් සීආර් ලහඳසිංහ පීඑස්සී ශ්‍රීලංඉ 2019.09.14 වන දින අභිනවයෙන් තනතුරේ රාජකාරි භාරගන්නා ලදී.

**ශ්‍රී ජයවර්ධනපුර මහා විද්‍යාලයෙහි පැරණි විද්‍යාගාරයේ රසායනික ද්‍රව්‍ය ඉවත් කිරිම.**

ශ්‍රී ජයවර්ධනපුර මහා විද්‍යාලයේ සිසුන් හට දැඩිව තර්ජනයක් ව තිබූ පැරණි විද්‍යාගාරය තුල පැවැති භාවිතයට නොගන්නා අවධානම් සහිත රසායනික ද්‍රව්‍ය ඉවත්කර ගැනීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය දැනුවත් කලද, එම කාර්යය ඉටුකර ගැනීමට නොහැකි විය. එම රසායනික ද්‍රව්‍ය ඉවත්කර ගැනිමේ අරමුණින් යුතුව එම විද්‍යාලයේ විදුහල්පති විසින් යුද්ධ හමුදාධිපති තුමන්ගෙන් කරන ලද ඉල්ලීමකට අනුව එම බැරෑරුම් කාර්ය ඉටුකරදීමේ වගකීම මෙම ඒකකය වෙත පවරන ලදී. ඉන්පසු එම රසායනික ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ගය කුමක්ද යන්න සොයාබලා එම කාර්යය 2019.07.30 හා 31 යන දෙදින තුලදීඉතා ආරක්ෂාකාරී ක්‍රමවේද අනුගමනය කර ගනිමින් 01 x 04 ක භට පිරිස් ප්‍රමාණයකි යොදා ගනිමින් ඉතා සාර්ථකව සිදුකරන ලදී.





**ස්වාධීන රූපවාහිනී මාධ්‍ය කණ්ඩායම සඳහා රසායනික, ජීව විද්‍යාත්මක**, **විකිරණ හා න්‍යෂ්ටික ප්‍රතිචාර දැක්වීම පිළිබඳ නිදර්ශණයක් ඉදිරිපත් කිරිම**.





රටේ සිදුවන වේගවත් සංවර්ධන ක්‍රියාවලියත් සමග රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණ හා න්‍යෂ්ටික ද්‍රව්‍යන් ආශ්‍රිත කටයුතුද වර්ධනයක් සිදුවී ඇත. එමෙන්ම, ඊට සාපේක්ෂව මෙවැනි ආපදාවන් සිදුවීමේ ප්‍රවනතාවද ඉහල යාම හේතුවෙන් එවැනි ආපදා සඳහා නිවැරදි තාක්ෂණික දැනුම හා උපකරණ යොදාගෙන ඉතා කාර්යක්ෂමව එළදායී ප්‍රතිචාර දැක්වීමේ රාජකාරීන් ඉටුකිරීම පිළිබඳව රටෙහි සිටින මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් යුතුව ඉංජිනේරු බළසේනාධිපති තුමාගේ මග පෙන්වීම යටතේ 2019.07.26 දින 01 x 37 ක භට පිරිස් ප්‍රමාණයකින් ස්වාධීන රූපවාහිනී මාධ්‍ය කණ්ඩායමක් (ITN) සඳහා රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණ හා න්‍යෂ්ටික ආපදා වලදී ප්‍රතිචාර දැක්වීම පිළිබඳ නිදර්ශණයක් පවත්වන ලදී.

# 16 වැඩපල රෙජිමේන්තුව ශ්‍රීලංඉ

ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය සතු සියළුම පස් කණින යන්ත්‍ර/වාහන වල අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සිදුකරනු ලබන මෙම ඒකකය 1990 වර්ෂයේ වැඩපල බළඝනයක් ලෙස ආරම්භකර 2017 අප්‍රේල් මස 20 වන දින 16 වැඩපල රෙජිමේන්තුව ශ්‍රිලංඉ වශයෙන් නවතමයෙන් ඒකකයක් ලෙස ස්ථාපනය කරන ඇති අතර දිවයින පුරා ස්ථානගත අණුබණ්ඩ 05 කින් සමන්විතව රාජකාරි කටයුතු ඉටුකරනු ලබයි.



වේදිකාව නිර්මාණය කරමින්

ශ්‍රී ලංකාව තුල සිදුකරනු ලබන ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා සෘජු දායකත්වයක් ලබා දෙනු ලබන මෙම ඒකකය වෙතින් සෙසු නිලයින් සඳහා වෘත්තීය පාඨමාලාද පවත්වමින් වෘත්තීය හමුදාවක් ඇති කිරීම සඳහා විශාල දායකත්වයක් ලබා දෙනු ලබයි.

තවද ඉහත දක්වා ඇති කාර්යයන්ට අමතරව මෙම ඒකකයේ සියළුම නිළධාරී/සෙසු නිලයින්ගේ සහභාගීත්වයෙන් මෑත කාලයේදී සිදුකරන ලද කාර්යයන් කිහිපයක් පහත දක්වා ඇත.


ඉදිකරන ලද වේදිකාව

- ආසේමු(යා) ආඥාපති තුමන්ගේ ඉල්ලීම පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු තුමන්ගේ උපදෙස් පරිදි මෙම ඒකක අණදෙන නිළධාරීගේ අධීක්ෂණය යටතේ නිළධාරී/සෙසුනිළයින් විසින් නවතමයෙන් නිර්මාණය කරන ලද වේදිකාව.
- නිදහස් පෙළපාලියෙහි රථ පෙළපාලිය සඳහා ඉංජිනේරු බළකා අභිමානය විදහා දැක්වීම සඳහා එක් කරන ලද යන්ත්‍ර/වාහන වර්ණාලේප කිරීම සහ අළුත්වැඩියා කිරීම.
- ඉංජිනේරු බළකායට කීර්තියක් අත්කර දුන් මෙම ඒකකය යටතේ පාලනය වන ක්‍රීඩා කණ්ඩායම් අන්තර් රෙජිමේන්තු තරඟ සඳහා සහභාගී වී ලබාගන්නා ලද ජයග්‍රහණයන්.

ඉහත කාර්යයන් මෙම ඒකක නිළධාරී/සෙසු නිලයින්ගේ සහභාගීත්වයෙන් ඉටුකරන ලද අතර, එමගින් මෙම ඒකකයේ මෙන්ම සමස්ථ ඉංජිනේරු බලකායේද ප්‍රතිරූපය ඉහල නැංවීමට විශාල රුකුලක් වේ.


ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු තුමන් වේදිකාව අධීක්ෂණය කරමින්


70 වන ජාතික නිදහස් පෙළපාලිය සඳහා 16 වැඩපල රෙජිමේන්තුව ශ්‍රිලංඉ දායකත්වය


අන්තර් රෙජිමේන්තු ක්‍රිකට් තරඟාවලිය 2018 - බී කාණ්ඩයේ ශූරතාවය ඉංජිනේරු බළකා ක්‍රිකට් සංචිතය වෙත ලබා ගනිමින්.


අන්තර් රෙජිමේන්තු මුෂ්ඨි ප්‍රහාරක තරඟාවලිය 2019 නියෝජනය කරමින් ඉංජිනේරු බළකා මුෂ්ඨි ප්‍රහාරක සංචිතය.

# 4 වන (සෙව්) ඉංජිනේරු රෙජිමේන්තුව






## වයඹ පළාත් රණවිරු ස්මාරකය ඉදිකිරීම.

යුද්ධයේ දී දිවිපිදූ වයඹ පළාත තුල පදිංචිව සිටි සියළු රණවිරුවන්ගේ නාමයන් සඳහන් කරමින් 2016.11.30 දින වයඹ පළාත් අතිගරු ආණ්ඩුකාරවරිය වන පියසීලී රත්නායක මැතිණිය හා වයඹ පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය ධර්මසිරි දසනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රණවිරු ස්මාරකය ඉදිකිරීම සඳහා මුල්ගල තබන ලදී.

4 (සෙව්) ශ්‍රීලංඉ අණදෙන නිලධාරී මේජර් ටීඑම්පී ජලාල් ශ්‍රීලංඉ ගේ මඟ පෙන්වීම යටතේ 4 (සෙව්) ඉංජිනේරු රෙජිමේන්තුවේ නිලධාරී/සෙසුනිළයින්ගේ සැලසුමකට අනුව හා ශ්‍රම දායකත්වයෙන් රු:27,201,930.53 ක වියදමින් යුතුව ඉදිකරන ලද රණවිරු ස්මාරකය 2018.05.11 දින විවෘත කරන ලදී.






## සෙ/244079 ඉසෙ කේකේආර්අයි සම්පත් යන සෙබළා හට නව නිවසක් ඉදිකර දීම.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉංජිනේරු බළකායට අයත් ක්‍රියාන්විත රාජකාරියේ නියුතුව සිටියදී සතුරු බිම්බෝම්බයකට හසුවී ආබාධයට ලක් වූ කුරුණෑගල, වැල්ලව ප්‍රදේශයේ පදිංචි කේකේආර්අයි සම්පත් යන සෙබළා සඳහා 2019.03.21 වන දින නව නිවසක් ඉදිකරදීම වෙනුවෙන් වැඩ ආරම්භ කරන ලදී. 4 (සෙව්) ශ්‍රීලංඉ අණදෙන නිලධාරී මේජර් ටීඑම්පී ජලාල් ශ්‍රීලංඉ ගේ මඟ පෙන්වීම යටතේ 4 (සෙව්) ඉංජිනේරු රෙජිමේන්තුවේ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සැලසුමකට අනුව රුපියල් ලක්ෂ දහයක් වටිනා නව නිවස ඒකක නිලධාරී/සෙසු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉතා කෙටි කාලසීමාවක් තුලදී ඉදිකර 2019.06.08 වන දින ඔහු වෙත භාරදෙන ලදී.






## පොළොන්නරුව රාජකීය විද්‍යාලීය තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය.

රජරට නවෝදය - ජනපති වැඩසටහන සහ පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව රු:29,292,864.89 ක වියදමින් යුතුව 4 (සෙව්) ශ්‍රීලංඉ අණදෙන නිලධාරී මේජර් ටීඑම්පී ජලාල් ශ්‍රීලංඉ ගේ මඟ පෙන්වීම යටතේ මෙම ඒකක ශ්‍රම දායකත්වයෙන් 2018.04.04 දින පොළොන්නරුව රාජකීය විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 2019.09.05 දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.

# 15 වන (සෙව්) ඉංජිනේරු රෙජිමේන්තුව

**නිවාස ව්‍යාපෘති**

ප්‍රදීපා ලක්සෙවන පදනම විසින් ගරු ආරක්ෂක ලේකම් තුමාගෙන් කළ ඉල්ලීම පරිදි වැලිවේරිය, රතුපස්වල, නැදුම්ගමුව පාරේ සපුමල් උයනේ රණවිරු මාවතේ ළමා නිවාසයක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය ලබා දීමට යුද්ධ හමුදාපති තුමා විසින් ඉංජිනේරු බලසේනා මූලස්ථානය වෙත අනුමැතිය ලබාදීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිය මෙම ඒකකය වෙත ලබා දෙන ලදී.

ඒ අනුව 15 (සෙව්)ශ්‍රීලංඉ ඒකක සෙනීන් යොදවා ශ්‍රම දායකත්වයෙන් 2017.03.28 දින වැඩ ආරම්භ කර 2018.11.29 දින වැඩ අවසන් කල දෙමහල් ළමා නිවාසය හා බදු මැදුර ප්‍රදීපා ලක්සෙවන පදනම වෙත භාර දෙන ලදී.








මෙම ඒකක නිලධාරී/සෙසු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් කෑගල්ල ප්‍රදේශයෙහි ඉදිකල නව නිවස 2018.11.25 දින ආරම්භ කර 2019.02.13 දින වැඩ අවසන් කර ආබාධිත රණවිරුවකු වන 1 කාඉරෙ ශ්‍රීලංඉ ඒකකයට අයත් සෙ/24445 කෝප්‍රල් බුද්ධික ඊඑස් යන කොනොනි හට භාර දෙන ලදී.





මෙම ඒකක නිලධාරී/සෙසු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් තලගල ප්‍රදේශයේ ඉදිකල නව නිවාසයේ ඉදිකිරීම් කටයුතු 2019.04.01 දින ආරම්භ කර 2019.06.08 දින වැඩ අවසන් කර හදිසි අනතුරකින් මියගිය සෙ/243923 ඉසෙ ප්‍රියදර්ශණ පීඩීආර් යන සෙබළාගේ ලගම ඥාතියා වෙත භාර දෙන ලදී.





# ශ්‍රී ලංකා යුධ ඉංජිනේරු පාසල

ශ්‍රී ලංකා යුධ ඉංජිනේරු පාසල වර්ෂ 1956 මැයි මස 06 වන දින අම්පාර කොන්ඩුවට්ටුවාන් ප්‍රදේශයේ ආරම්භ කර පසුව 1979 පෙබරවාරි මස 16 වන දින ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ස්ථාපනය කරන ලදී. පසුව ත්‍රිකුණාමලයේ කෙසෙල් තුඩුවේ සිට 1989 මැයි මස ඇඹිලිපිටිය තුංකම යුධ හමුදා කඳවුරේ ප්‍රතිස්ථාපනය වන ලදුව 1989.08.18 වන දින යුද්ධ හමුදාධිපති (එවකට) ලුතිතන් ජෙනරාල් එච් වනසිංහ වීඑස්වී එන්ඩිසි විසින් ඉතා උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.




මෙම පුහුණු පාසල මගින් ඉංජිනේරු බලකායේ නිලධාරීන් හා සෙසු නිළයින් හට වෘත්තිය පාඨමාලා සහ යුධ හමුදාවේ පාබල සෙබළුන් හා ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් හා සෙසු නිළයින් හට පාඨමාලා පවත්වනු ලබන අතර, මීට අමතරව විදේශ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින් හටද පාඨමාලා පවත්වනු ලබයි.











මෙම පාඨමාලාවන් ඉතා උසස් ලෙස හා ක්‍රමානුකූලව පැවැත්වීම සඳහා සුදුසු පරිසරයක් හා පහසුකම් පැවතීම ඉතා වැදගත් වන අතර, ඊට අවැසි නවීකරණ කටයුතු මෑත කාලයේදී ඉතා සීඝ්‍ර ලෙස ඉටුකරනු ලැබිණි. ඉන් සමහරක් පහත සඳහන් පරිදි වේ.

ඉංජිනේරු කෞතුකාගාරය නවීකරණය කිරිම.
නව කොනොනි භෝජනාගාරය විවෘත කිරිම.
පාසල තුල නව පංසලක් ස්ථාපනය කිරිම.
එවකට පැවති රොංකෝ නිවාඩු නිකේතනය නවීකරණය කිරිම.
පාඨමාලා සිසුන්ගේ උත්සව කටයුතු සඳහා තොටුපල නම්වූ ගොඩනැගිල්ල ස්ථාපනය කිරීම.

තවද වර්තමානයේ පහත සඳහන් ව්‍යාපෘති මේවනවිට ඉදිවෙමින් පවතී.





නවතමයෙන් ඉදිවෙන බෝට්ටු තොටුපල.
බනි/සැරයන් නිවස්නය ප්‍රතිසංස්කරණය කිරිම.

ඉහත කාර්යන් මෙම පුහුණු පාසලෙහි සියළු නිලධාරීන්ගේ හා සෙසු නිලයින්ගේ සහභාගීත්වයෙන් ඉටු කරනු ලැබූ අතර, මෙම නවීකරණ කටයුතු මගින් මෙම පුහුණු පාසලලෙහි ප්‍රතිරූපයද ඉහළ නැංවිමට මහත් රුකුලක් විය.

# මාලි රාජ්‍යයේ ශ්‍රී ලංකා යුධ ඉංජිනේරුවන්ගේ සුරූ විරුකම්




එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලෝකයේ සාමය සහ සංහිඳියාව ප්‍රතිස්ථාපනය කිරීම වස් ස්ථාපනය කර ඇති සාම සාධක මෙහෙයුම් අතරින් මාලි රාජ්‍යයේ ස්ථාපිත මිනුස්මා (MUNUSMA) සාමසාධක මෙහෙයුම බිහිසුණුම හා ජීවිත අවධානම ඉහලම මෙහෙයුමක් වන අතර එදා මෙදා තුර සාමසාධක මෙහෙයුම් ඉතිහාසයේ ත්‍රස්ථවාදී ප්‍රහාර හේතුවෙන් සාමසාධක සෙබලුන් වැඩිම පිරිසක් තම ජීවිතවලින් වන්දි ගෙවා ඇති මෙහෙයුමද වේ. මාලී හි ක්‍රියාත්මක අතිබිහිසුණු ත්‍රස්ථවාදී කණ්ඩායම් වල ප්‍රහාර හේතුවෙන් එක්සත් ජාතීන්ගේ නාමයෙන්, ලෝක සාමය වෙනුවෙන් සහ තම රටෙහි ප්‍රෞඩත්වය වෙනුවෙන් ක්‍රියාත්මකවුනු සාමසාධක සෙබලුන් විශාල ප්‍රමාණයක් තම ජීවිත පූජාකර ඇති අතර ඊට ආසන්න ප්‍රමාණයක් ආබාධිත තත්වයට පත්ව ඇත. එම සිදුවීම් මාලාව මගින් මෙම මෙහෙයුමේ ඇති බිහිසුණු බව හා කටුක බව ප්‍රත්‍යක්‍ෂවේ. ඓතිහාසික යුධ ජයග්‍රහණ





හා කීර්තිය පෙරදැරි කරගනිමින් ශ්‍රී ලංකා රජයද, එක්සත් ජාතීන්ගේ සංවිධානයට ලෝක සාමය ආරක්‍ෂා කිරීමට සහය දීම උදෙසා තම භට කණ්ඩායම් 2017 වර්ෂයේ දෙසැම්බර් මස 24 වන දින මාලි රාජ්‍යය බලා පිටත්කරහරින ලදී. එසේ පිටත් වූ ශ්‍රී ලංකා සාම සාධක සෙබලුන් මාලි රාජ්‍යයේ සාමය ස්ථාපිත කිරීම සඳහා වූ මිනුස්මා (MUNUSMA) මෙහෙයුම සඳහා සංග්‍රාමික ප්‍රවාහන ආරක්‍ෂක කණ්ඩායමක් වශයෙන් ගාඕ සුපර් කෑම්ප් හි ස්ථානගත කරන ලද අතර මෙම මෙහෙයුම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදා ඉංජිනේරු බළකායේ එක් නිලධාරියෙකු සහ සෙසු නිලයින් 15 කින් සමන්විත ඉංජිනේරු භටපිරිසක් (SAPPARS) සහභාගී විය. මෙම මෙහෙයුම් වලට ශ්‍රී ලංකා සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම සම්බන්ධවන වනවිට, එම මෙහෙයුමට සම්බන්ධ රටවල් විශාල සංඛ්‍යාවකට අයත් සාමසාධක

සෙබලුන්, වාහන හා උපකරණ සතුරා විසින් විනාශ කරමින් පැවතිනි. මෙම කාලසීමාව සතුරු පහරදීම් බහුලව සිදුවූ කාලපරිච්ඡේදයකි. මෙහිදී කඳවුරු වලින් පිටත මාර්ගවල ගමන්ගත් සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම් හා මුර සංචාරයන් ඉලක්ක කර ගනිමින්, වැඩි දියුණු කරන ලද කෘතිම බෝම්බ පුපුරුවා හැරීම්, (Improvised Explosive Devices – IED) රැකසිට පහරදීම් (Ambush) සහ සංකීර්ණ ප්‍රහාරයන් (Complex Attack) එල්ලකල අතර, කඳවුරු වෙතටද මිසයිල හා මෝටාර් (In Direct Fire – IDF) ප්‍රහාරයන් දියත් කරන ලදී.



තත්වය එසේ තිබියදී ශ්‍රී ලංකා යුධ හමුදා ඉංජිනේරු හට පිරිස් එම සතුරු ප්‍රහාර මධ්‍යයේ උපායශීලීව, උසස් පුහුණුව තුලින් ප්‍රගුණ කරගත් වෘත්තීමය දැනුම සහ හැකියාවන් මෙන්ම යුධ අත්දැකීම් ද උපයෝගී කර ගනිමින් තම කාර්‍ය භාරය මනාව ඉටු කරන ලදී. වර්ෂ 2018 මාර්තු 28 දින සිට 2019 ඔක්තෝබර් 24 දින දක්වා දුරස්ථ පාලක මගින් ක්‍රියා කරන වැඩි දියුණු කරන ලද අධිබලැති කෘතිම බොම්බ (Remote Control Improvised Explosive Devices - RCIED) 07 ක් සහ තමා විසින්ම ක්‍රියාත්මක කරගන්නාවූ අධි බලැති කෘතිම බෝම්බ (Victim Operated Improvised Explosive Devices – VOIED) 02 ක් ඉතා සාර්ථකව නිශ්ක්‍රිය කර ඉවත් කරන ලදී.







ඉහත සඳහන් ක්‍රියාන්විත සඳහා මාලි රාජ්‍යයේ ස්ථාපිත සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩයේ සියළුම ඉංජිනේරු බළකා නිලධාරී/සෙසුනිළයින් සක්‍රියව සහභාගී විය. එම විශිෂ්ඨ ක්‍රියාන්විත එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේඛම් තුමාගේ ඇතුලු නිව්යෝක් ප්‍රධාන කාර්යාලයේ විශේෂ ඇගයීමකට ලක්වූ අතර මිනුස්මා සාමසාධක මෙහෙයුමේ බළකාධිපතිතුමාගේ හා සියළුම මිනුස්මා කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ ඇගයීමටද ලක්විය.

තවද, මෙතෙක් මිනුස්මා සාම සාධක මෙහෙයුම් වලදී කිසිඳු රජයකින් මෙවැනි ආකාරයේ බෝම්බ නිශ්ක්‍රිය කිරීමක් සිදු කර නොමැති බවද සඳහන් කල යුතුය. තම ජීවතයට එල්ල විය හැකි අවධානම ගැනද නොසිතා තම රටේ මෙන්ම අන් රටවලද සාමසාධක සෙබලුන් ආරක්ෂාකර ගැනීම සඳහා ක්‍රියාන්විතයට සක්‍රිය දායකත්වයක් ලබා දුන් ශ්‍රී ලංකා යුධ හමුදා ඉංජිනේරු බළකා හට කණ්ඩායමේ නාමය මිනුස්මා මෙහෙයුම් ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙන්නේ පැවරී තිබූ රාජකාරිය නිර්භීතව හා ඉතා දක්ෂ ලෙස ඉටුකිරීම හේතුවෙනි. මේ මොහොතේ පවා ලෝක සාමය ආරක්ෂා කිරීම උදෙසා තම රන් දහඩිය පොළව මත පතිත කරමින් සහ ඒ වෙනුවෙන් තම ජීවිත කැප කරමින් සිටින ශ්‍රී ලංකා යුධ හමුදා ඉංජිනේරු බළකා නිලධාරී/සෙසුනිළයින් අප සිහිපත් කරන්නේ ඉතාමත් ගෞරව බහුමානයෙන් යුක්තවය.

# ACHIEVEMENTS OF SAPPER OFFICERS



O/65349 Maj JN Keerthisinghe SLE of 8 Field Engineer Regiment has won the first in order of the merit in the Unit Command Course conducted at the Officer Career Development Centre, Buttala from 01 May 2018 to 01 August 2018. 20 student officers who are potential to be appointed as the Commanding Officer appointment participated in the course.



O/69980 Capt AAPV Suraweera SLE of 10 Field Engineer Regiment was awarded the first in order of merit in Officers Intelligence Staff Course (OISC) No. 19 (All Arms). The course was conducted from 04 June 2018 to 10 August 2018 at Military Intelligence Training School, Pelawaththa. He secured the first place out of Thirteen Army officers, Three Navy officers, Two Air Force officers and Two STF officers.



O/69589 Capt PHT Deshan SLE of 1 Field Engineer Regiment was the first in order of the merit in Captain to Major promotion examination in 2018. He has secured the place out of all the Captains of Sri Lanka Army, who have faced the examination.



O/70301 Capt KP Kaluarachchi SLE of 12 Field Engineer Regiment was the first in order of the merit in Lieutenant to Captain promotion examination in 2018. He has secured the first place out of all the Lieutenants of Sri Lanka Army, who have faced for the examination.



O/70328 Capt PN Ariyasinghe SLE of 12 Field Engineer Regiment has won the award for the best student officer in the Engineer Officers' Young Officer Course (X) conducted at Sri Lanka School of Military Engineering, Thunkama, Embilipitiya from 07 January 2019 to 02 May 2019. 14 Sapper Officers participated in the course.



O/10672 Lt RMSS Rathnayaka SLE of 4 (V) SLE has won the award for the best student officer in the Master Fitness Instructor Course (21) conducted at Army School of Physical Training, Kakul, Pakistan from 02 July 2019 to 15 September 2019. 16 Pakistan officers, 05 Saudi Arabian officers, 04 Sri Lankan Officers and 01 Nepal officer participated in the course.

# CORPS OF SRI LANKA ENGINEERS TRAINING TEAM AT MALDIVES




As request made by the Defence Wing of Embassy of the Republic of Maldives in Sri Lanka to conduct basic and advance course on Bomb and Improvised Explosive Device Disposal Training (BIEDDT) for Maldivies National Defence Force (MNDF), a training team constituted with five officers and five Other Ranks deployed at MNDF Central Headquarters, Khadhoo Island in Maldives. The opening ceremony of the Basic Course was held on 16 October 2019 with the participation of senior officials of MNDF and the Chief Field Engineer Sri Lanka Army Major General TJ Nanayakkara RWP VSV USP ndu graced the occasion as the Guest of Honour representing the Commander of the Sri Lanka Army.



Bomb and Improvised Explosive Device Disposal Basic Course for 38 MNDF personnel will be held from 16 October 2019 to 29 December 2019 and the Advance Course is schedule to be conducted from 02 January 2020 to 19 February 2020. The MNDF Central Headquarters at Khadhoo located 232 kilometers southwards to Capital City Male provides all training amnesties for both training courses.



The Chief Field Engineer Major General TJ Nanayakkara RWP VSV USP ndu during his key note speech value the opportunity extended to the Sri Lanka Army to conduct a training module for the personnel of the Maldivian National Defence Force. He highlighted the bilateral relations which the Maldives and Sri Lankan enjoy are very cordial and historical. He further added that the training activities in this nature between the two Armies would definitely strengthen the already strong bond between the two forces.

The grand opening ceremony was graced by the Commandant Service Corps Brigadier General, Brigadier Hamid Shafeeq, Commander of Ordnance and Disposal Unit Colonel Mohamad Shareef, Deputy Commander College of Defence and Security Studies Lieutenant Colonel Ibrahim Ashraf, Officers, Student officers and Other Ranks of MNDF.

This is the second occasion that the Corps of Sri Lanka Engineers conducting Bomb and IEDD Training for the Maldivian National Defence Force, previously in 2011 prior to the SAARC Summit the first training team has conducted the same training module. The present training team deployed is headed by Lieutenant Colonel CD Wickramanayake WV RSP SLE along with officer instructors Major KKP Pussewela RSP SLE, Major KANPK Kodithuwakku psc SLE, Major AJ Gunawardena USP SLE, Captain KVP Gunesekara SLE and Other Rank Instructors Warrant Officer I KM Weerarathne USP, Warrant Officer II Kumarasiri VRN USP, Warrant Officer II Samantha Bandara MM USP, Staff Sergent Karunarathne HGC and Corporal Nishantha Kumara HGC.



# මානුෂවාදි බිම්වෙඩි ඉවත් කිරීමේ සුනඛ පවුලට නව සාමාජිකයින් පස් දෙනෙක්

## මානුෂවාදි බිම්වෙඩි ඉවත් කිරීමේ HDM/MDD/35 EMA නැමැති සුනඛයා විසින් පැටවුන් 05 දෙනෙකු බිහිකරන ලදී.



HDM/MDD/52 BRANDY



HDM/MDD/53 BROWN



HDM/MDD/54 MISCO



HDM.MDD.55 KRISNER



HDM/MDD/35 EMA



HDM.MDD.56 SADOW

ශ්‍රී ලංකා ඉංජිනේරු බළකායට අයත් 14 රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලී සහ න්‍යෂ්ටික ප්‍රතිචාර රෙජිමේන්තුව ශ්‍රීලංඉ ඒකකයේ බෝම්බ නිෂ්ක්‍රිය කිරීමේ බලඝණයට අයත් සුනඛ කණ්ඩයේ HDM/MDD/35 EMA නැමැති ගැහැණු සුනඛයා ශ්‍රී ලංකාව තුල උපත ලැබූ සුනඛයෙක් වන අතර, HDM/MDD/35 BIHO නැමැති සුනඛයා ඇමෙරිකානු එක්සත් ජනපදයේ ඉපදී ලංකාව තුල මානුෂවාදි බිම් වෙඩි ඉවත් කිරීමේ රාජකාරි සහ බෝම්බ නිෂ්ක්‍රිය කිරීමේ රාජකාරි ඉටු කරමින් දේශයට අමිල මෙහෙවරක් ඉටු කරනු ලබන සුනඛයින් වේ.

ඉංජිනේරු බළකායේ මානුෂීය බිම් වෙඩි ඉවත් කිරීමේ සුනඛයින් අතරින්, දෙවනි වරටත් 2019.02.10 වන දින HDM/MDD/35 EMA නැමැති සුනඛයා, HDM/MDD/35 BIHO නැමැති පිරිමි සුනඛයා සමග එක්වී 2019.04.11 දින පිරිමි සුනඛ පැටවුන් 05 දෙනෙකු බිහි කරන ලදී. මෙම ඒකකය වෙතින් සිදුකරන ලද ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකා ඉංජිනේරු බළකායට එක් වූ නව සුනඛ සාමාජිකයින් දැනට, වෙඩි ද්‍රව්‍ය සෙවීමේ රාජකාරි සඳහා පුහුණු කරමින් පවතී.

The Annual General Meeting of the Seva Vanitha Branch of the Corps of Sri Lanka Engineers was held on 11 December 2018 at the Cinema Hall of Security Force Headquarters (Jaffna). The meeting was presided by the President Engineers Seva Vanitha Branch Mrs Ajantha Hettiarachchi. A guest lecture and a donation programme followed by a family get-together were some significant part of the event.

During the AGM, tasks carried out in the present year were reviewed and the proposed plan for the upcoming year was discussed. Further, new office bearers were appointed for the coming year. The guest lecture on the "Role of Woman in the present Society" was delivered by senior counselor Mrs Ishama Kariyakarawana.

The AGM was followed by a family get-together with the participation of families of the Seva Vanitha members and past Seva Vanitha members. The event consisted of some lively entertainment and fun games for members and their kids.

In addition, an excursion was arranged for members and their families to visit the Delft Island and Nagadeepa temple. Finally the AGM was concluded with a donation programme to distribute dry ration packs and sanitary items for selected needy families in Jaffna.



# ANNUAL GENERAL MEETING OF THE ENGINEER SEVA VANITHA BRANCH 2018
















# DONATION FOR DIFFERENTLY ABLE WAR VETERANS

A donation of gift packs for the differently able soldiers of the Corps of Sri Lanka Engineers was held at the Corps Headquarters in Panagoda on 29 December 2018. This event was organized by the Seva Vanitha Branch of the Corps of Sri Lanka Engineers in collaboration with the Lions Club of Makola on the direction of the Colonel Commandant.

On this event an electric motor tricycle was donated to S/238418 Cpl Janaka KG who had lost the use of his lower limbs while performing his duties. This donation was made on the request by the Colonel Commandant to the Army Seva Vanitha Unit and the tricycle was sponsored by Mr Sanath

The donation programme was held with the patronage of Major General DDUK Hettiarrachchi RSP VSV USP ndu psc Colonel Commandant of the Corps of Sri Lanka Engineers and Mrs Ajantha Hettiarrachchi President Seva Vanitha Branch of the Corps of Engineers. Representatives of the Lions Club, Seva Vanitha members, Officers and Other Ranks participated in this donation programme.







# INITIATIVES TAKEN BY THE SEVA VANITHA BRANCH TO UPLIFT THE WELFARE FACILTIES OF WAR HEROES FAMILIES

Seva Vanitha Branch of Corps of Sri Lanka Engineers launched a mega welfare project which was ceremonially held on 12 Feb 2019. On the guidance of the Colonel Commandant Major General D D U K Hettiarrachchi RSP VSV USP ndu psc 2 houses were constructed at Wadduwa and Kegalle and declared open facilitating 2 differently able soldiers of 1 Field Engineer Regiment. Mr Mohanashankar and Mrs Vathani Mohanashankar extended their generous donation of Rs 2 million to construct the two houses.

Simultaneously, another donation programme was held at RHQ SLE to award scholarships for children of differently able Soldiers' families. Mr Mohanashankar and Mrs Vathani Mohanashankar facilitated the allocation of Rs. 2,500 per month for each student to attend their studies.

The Colonel Commandant Corps of Sri Lanka Engineers and Commander Security Force Jaffna Major General D D U K Hettiarrachchi RSP VSV USP ndu psc, President Seva Vanitha Branch Corps of Sri Lanka Engineers, Centre Commandant Corps of Engineers and Senior Members of the Seva Vanitha branch were present at the occasion.

# EXTENDS SUPPORT TO FAMILIES OF WAR HEROES BY DONATING NEWLY CONSTRUCTED HOUSES

A deceased soldier's family and a soldier sustained injuries due to a landmine explosion at Muhamalai, Jaffna were given new houses. The keys for houses were auspiciously handed over after simple ceremonies held at those premises itself on 08 June 2019.

Out of the two soldiers S/244079 Spr Sampath KKRI of 6 Field Engineers Regiment sustained injuries to his right leg on 24 March 2009 and presently serving at the Ranaviru Apparel Alawwa. He is blessed with two months old daughter and the house which donated was constructed by the troops of 4 (V) SLE at Kurunegala.

The other house was constructed by the troops of 15 (V) SLE at Talagala and donated to S/243923 Spr Priyadarshana PDR of 8 Field Engineers Regiment who was passed away on 09 December 2017 while serving at Regimental Centre Panagoda. He had lived with his spouse and two kids.

These two constructions were successfully launched with the sponsership made by Mr and Mrs Mohanashankar, true Sri Lankans who are presently work in Dubai. Having heard the welfare activities and the contributions to maintain peace and harmony by the Army in Jaffna peninsula, the lady and the gentleman came forward to assist these soldiers who are in need of their assistance in different ways. Apart from this donation, the donors have funded to construct two more houses for differently abled soldiers of Sri Lanka Engineers in Kalutara and Kurunegala previously. Further, they have awarded number of scholarships to the children of the war heroes and some of the toilet fittings to construct the wash rooms of differently abled soldiers who sustained injuries during the conflict.

The Colonel Commandant Corps of Sri Lanka Engineers and the Commander Security Forces Jaffna Maj Gen Darshana Hettiarrachchi, the President Seva Vanitha Branch Corps of Sri Lanka Engineers Mrs Ajantha Hettiarrachchi, members of the Seva Vanitha Branch, Centre Commandant Brig Ravindra Dias, Senior Officers and Officers of the Corps attended the event.



# NEW CHAIRPERSON CORPS OF SRI LANKA ENGINEERS SEVA VANITHA BRANCH ASSUMES OFFICE

Mrs Sagara Gunawardena assumed office as the new President of the Corps of Sri Lanka Engineers Seva Vanitha Branch during a charming ceremony held at the Headquarters Corps of Sri Lanka Engineers on 29 July 2019. On her arrival at the Corps Headquarters the new president was warmly welcomed by the senior members of the Seva Vanitha Branch. Mrs Sagara Gunawardena assumed duties at Seva Vanitha Office amidst chanting of Seth Pirith by "Maha Sanga". After assuming the office, all members greeted the new chairperson extending their warm wishes.

Subsequently the new president having a discussion with all the members expressed her gratitude for the former president Mrs Ajantha Hettiarachchi for her invaluable service rendered during her tenure and requested the same assistance to undertake the future activities of the Sewa Vanitha branch successfully.














# SEVA VANITHA BRANCH CORPS OF SRI LANKA ENGINEERS BIDS FAREWELL TO FORMER CHAIRPERSON

The farewell hosted to the outgoing Chairperson of Seva Vanitha Branch of Corps of Sri Lanka Engineers was held at Corps Headquarters, Panagoda on 17 August 2019. A monthly meeting has been organized coinciding with the event. Day's events commenced with an enlightening guest lecture conducted by Dr Sanath Gamage on "Eight Facts Theory". Monthly meeting was headed by Mrs Sagara Gunawardena and new office bearers were appointed.

The Farewell Dinner hosted to the outgoing Chairperson was held at the Officers' Mess RHQ SLE at 1900 hours. Mrs Ajantha Hettiarrachchi on her arrival was warmly welcomed by Mrs Sagara Gunawardena. A documentary video highlighting the welfare and social activities conducted during the tenure of Mrs Ajantha Hettiarrachchi was displayed. Further, a photo album was presented to the outgoing Chairperson highlighting the significant events held during her tenure. Mrs Ajantha Hettiarrachchi paid her sincere gratitude to the Chairperson Mrs Sagara Gunarardena and all members for organizing wonderful farewell and greatly appreciated the excellent support extended to discharge her duties. The Chairperson of Seva Vanitha Branch Mrs Sagara Gunawardena highly appreciated the invaluable service rendered by Mrs Ajantha Hettiarachchi to uplift the welfare of injured and deceased war heroes and their families of the Corps and extended best wishes for the outgoing Chairperson and her loving family in their all future endeavors. Large gathering of members of the Seva Vanitha Branch were present at the event.








Mrs Sagara Gunawardena, the President Seva Vanitha Branch Corps of Sri Lanka Engineers visited Anuradapura and Ipalogama Wiru Kekulu Pre-Schools on 02 October 2019 to mark the World Children's Day. She is in charge of both the Pre-Schools and presently 358 children are attending. At the event, she distributed sweet packs to all the children, donated by Ceylon Biscuits Limited.

# THE PRESIDENT SEVA VANITHA BRANCH VISITED ANURADAPURA AND IPALOGAMA WIRU KEKULU PRESCHOOLS



# සෙබළ සිතුවිලි

සිතන්න

සල්ලිකාරකම් නම්බුකාරකම්
සදාකාලික නොමැති ලෝකයේ
මනුස්සකම සදාකාලිකයි

සෙ/242414
කෝප්‍රල් බංඩාර ඒජී

සසරක මතක

කවියක එතුන මතකය රැඳි පෙරදිනක
කඳුලක සිසිල සුසුමින් වියලිය නොහැක
අවපස අහස දිදුලන තරු එළි නෙතක
සසරක මතක ලෂු වී ලියවෙයි කවක

සෙ/248450
ඉසෙ රත්නායක ආර්එම්යූඑන්

නිවාඩු ඉවරයි

අදින් පස්සේ හැමදාම හිනාවක් අරන් එන්න
කෙනෙක් නැතිවෙයි
යන්නම ඕන නිසා නොවේය
යා යුතු නිසා

අද මම හිටිය තැන හෙට වෙන කෙනෙක්
ඉදීවි
ඔව් වෙන්න පලුවන්
වෙන්වීම වාගේම හමවීමක්
මේ ලෝකේ තියෙන නිසා

සෙ/4ඛ02689
ඉසෙ බංඩාර එච්එම්එන්පි

මිනිසාගේ ශක්තිය

මිනිසෙක් ශක්තිමත් වන්නේ
තම ශරීරයෙන් නොව
ඔහු තුල පවත්නා
ස්ථිර ආත්ම විශ්වාසයෙනි

සෙ/248605
ඉසෙ රත්නායක ආර්එම්යූඑන්

විවාහය

විවාහය ඔබට කොහොමත්
වාසිදායකයි
හොඳ බිරිඳක් ලැබුනොත්
ඔබ
සාර්ථක මිනිසෙකු වේවී
නපුරු බිරිඳක් ලැබුනොත්
ඔබ
දාර්ශනිකයෙකු වීමට මඟ සලසයි

සෙ/248929
ඉසෙ ගුණරත්න ආර්ඩීආර්කේ





විරු සිතෙහි දුක

රණවිරුවෙකු ලෙස අවිය අතදරා
දරා සිටිනා තනතුරේ
වගකීමක් නොමැත කිසිදා
සෙබළ සොයුරා වෙතට දැණුනේ

පහන් වන තුරු නිදිවරා
තනිවුනත් අවිය සමගින් යුධ බිමේ
විරුවාගේ දුක නොපෙනුනේ කිසිදාක
රජ මැදුරු වල සිටිනා මහතුනේ

සෙ/248886 ඉසෙ හේමන්ත

අපේ ඉස්කොලේ ප්‍රින්සිපල්

කිරි කැල්ලෙ කිරි කපන අම්මයි
සිමෙන්ති බදාම අනන තාත්තයි
එක වේලක් හොයාගන්න
පැය විසිහතරෙම ඔට්ටුවෙන මේ දෙන්නාට
හෙට එන්නලු
අම්මට සාරිය ඇදලා
තාත්තට කලිසම් කමිස ඇදලා

සෙ/248090
ඉසෙ චන්ද්‍රලාල් ඩීඑම්ආර්



## මුලාවට මායාවක් ද? දුරකථනය

සෙනෙහස ආදරය මොබයිල් එක ඔස්සේ
ඇවිදින් ගලාගෙන අප හට රිසි සේ
සිටියත් දුරක දුක නැ හදවත අස්සේ
මොබයිල් එකයි හද සනසන මිහිරි සේ

සැනසුම ලබා දි සැමටම සිතට ලැදී
අපමන මෙහෙවරක් කරනව සතුට දීදී
මොබයිල් එක ලොවෙ දිදුලයි ඉහල රැදී
පැටලේනු එපා කිසිදින වරදේ බැදී

මොබයිල් එකෙන් ආදර ගග පිහිනීම
අත මිට තියෙන දේ හිස් වෙයි නොදනීම
තේරුම රැගෙන පිවිත ගග පැද යාම
සරු කරවයි ඔබෙ සිත තුල සැනසීම

බැදුනොත් වරදේ මොබයිල් එක පෙරටගෙන
අතමිට හිස් වෙනවා ඔඹටත් නොදැනෙන්න
කලබල වෙලා යන විට ඔබේ දිවිගමන
මග නවතීවි නොසිතුව ලෙස ඔන්න

ආදරයෙන් බැදි ආදර මුදු පලදවන
බිරිදට හොරෙන් වෙන ඇසුරක පැටලවෙන
කලකින් දුරස් වී ගියොතින් තරහා ගෙන
අසරන විය හැකිය ලොව පිහිටක්නොමැති තැන

සෙ/ඞී101250
ඉසෙ කුමාර ඒකේපිආර්

## රණවිරුවා

රට වෙනුවෙන් දිවි පුදලා
අප රැක ගැනුමට සැමදා
කල සේවය බොහෝ අගනා
ගරු කරනෙමු අප සැමදා

තිස් වසරක් සටන් කලා
රට දැය බේරා ගත්තා
අපමණ දුක් ඔබ වින්දා
නොමැරෙති ඔබ නම සැමදා

දේශයේ නම රැක්කා
සතුරන් පලවා හැරියා
සිංහ ධජය ඔසවාලා
එඩිතරකම පෙන්වූවා

මහ වන මැද ගතවීලා
නිසිලෙස අහරක් නොගෙන
කුස ගින්නත් නොම බලලා
සටනින් ඉදිරියටම ගියා

සෙ/247834
ලාකෝ රපිත දීපාල් ආර්ආර්

## අම්මා

එදා වගේ අදත් මාගේ අම්මා
සියළුම දුක් කරදර ලග සිටිනා අම්මා
ලොව ජය ගන්නට ශක්තිය දුන් අම්මා
මතු භවයෙත් මගේම වී ඉපදේවා මගේ අම්මා

රස ආහාර මට කවලා
ඇති දැඩි කර මා හැදුවා
ලේ කිරි කර දුන් අම්මේ
මතු භවයේදී ඔබ බුදු වේවා

සෙ/243490
ලා/කෝ පුෂ්ප කුමාර කේවීජේ

## කැඩපත

විශ්වාසය පොරොන්දු බැඳීම්
කවදාවත් බිඳින්න එපා
මොකද ඒවා බිදෙද්දි සද්දෙ නැගුන්නැති උනාට
දැනෙන රදුම දරාගන්න අමාරුයි

සෙ/243589
ලාකෝ ජයසුන්දර කේඑම්



## ජීවිතය

කඳුලෙන් ජීවිතය දකින්නා
සිනහවෙන් ජීවිතය දකින්නාට වඩා
අත්දාකීම් ජිවිතයට
එකතු කරගනී

සෙ/249466
ඉසෙ බංඩාර කේඑම්කේඑස්

## දෛවය

දෛවය කියයි නම්
සිගමන් යදින්නට
හිගකම් කිවහැකිද
රජගෙයි ඔටුන්නට

සෙ/249250
ඉසෙ ප්‍රියදර්ශණ කේඑම්

## ලංකා ලංකා

ලලිත කලා ඔප දමා
ගල සැරසු රූ ලංකා
සිගිරියේ මන බන්දන
ලදුනගේ අසිරිය පතා

සමනොල සිරසින් බැස
රිදී දහර දෙන රග
කළු මහවැලි කැලණි නදී
හිම් සයුරට යන රග

හංස ගිරා පරවිදු
කව් සේකර තිසරද
රහල් සමිඳ ගැන පවසයි
කවියෙන නිති පද බැද

රුහුණු පිහිටි මායා
බොදු බැතිගෙන ආවා
අනුරා සහ පුලතිසි පුර
පිපිමද නල ආවා

සෙ/249466
ඉසෙ බංඩාර කේඑම්කේඑස්

## අහිමි පෙම

කලත් හදවතින් උතුරන්න ආදරය
හිමිකර ගන්න නොහැකිය මා හට
වෙනකෙකුට දෙන්න සවි නෑ මගෙ සිත
වෙස්සන්තර නොව මා දන්දෙන්නට නුබ

සෙ/248267
ඉසෙ බංඩාර අයිඑම්පීආර්කේ

## ජීවිතය

ජිවිතය පුරාවට
උපයා ගත යුතු
රැකගත යුතු
වටිනාම ධනය තමා
විශ්වාසය සහ මනුස්ස කම

සෙ/249470
ඉසෙ දිසානායක ඩීඑම්

## අහිමි නුඹ

මතකය සිහිවෙන සිතකට
ආදරබර මගෙ හදවත
දරාගෙන මා සිහියට
ඔයා එන්නෑ මගේ අසලට
කියාගන්නට නොහැකිව
මගේ ලෙන්ගතු පෙම් හිත
සදහටම ඔබ වෙත
තියාගන්නම දෙන්නද
ඔයා එනවද ලගටම
බලා ඉන්නම් කිව්වට
ඇස් රිදෙනකම් උන්නට
දැනුනෙවත් නෑ නුඹ හට
ඔයා එන්නෑ ලගටම
තේරුමක් නැති කමකට
පෙම් කලා මම තව තව
ගනන් නොගෙනම ඔබ අද
ගියා වෙනතක නොසිතම
ඔයා එන්නෑ ලගටම

සෙ/240264
සැරයන් කොඩිතුවක්කු ඒඑම්ආර්

## වැරැද්ද

තමන් වැරදි කරමින් අනෙකුත්
උන්ගේ වැරදි සොයනවට වඩා
අගනේ කල වැරදි සදාගත්
කෙනෙකුට ඉදිරියට යාම සඳහා
මග විවර කර දීම

සෙ/240927
කෝප්‍රල් දසනායක ඩීඑම්

## ජීවිතය සුන්දරව ගෙවන්න

හොයාගන්න හීන මවන කෙනෙක් නෙමෙයි
ඔබේ හීන සැබෑ කරන කෙනෙක්
ආදරේ වචන වලින්
කියන කෙනෙක් නෙමෙයි
ක්‍රියාවෙන් ඔප්පු කරන කෙනෙක්
සැක කරන හිර කරන
කෙනෙක් නෙමෙයි
නිදහස දෙන ඔබව විශ්වාස කරන කෙනෙක්
ඔබව කරදරයක් ලෙස හිතන
කෙනෙක් නෙමෙයි
ඔබව ලැබීම ලොකු භාග්‍යක්
යැයි සිතන කෙනෙක්

සෙ/242792
ලා/කෝ ගුණරත්න ඩීඩබ්ලිව්එස්

උණුහුමෙන් ගිලිහිලා

ඔය දෑස නිදි වරා
එනතුරා මා මග බලා
හිදිනවා මගේ පණ
උණුසුම අත දරා
ලේ කදුළු කිරි කලා
සෙනෙහසක් ඉපදුනා
ඒ බැදුනු උනුසුමෙන්
තව දිනක ගිලිහිලා

ගිනි අව්ය අත දරා
නිළ ඇඳුමෙන් බැබලිලා
අද මා හිදින්නේ
නුබේ සව්ය හිත දරා

සිතෙයි මට හෙට දිනෙක
ඔය උණුහුම විදින්නට
අවසර නැ අම්මේ
සේවයට ගැති වෙලා

සෙ/බ්101146
ඉසෙ රාමනායක ආර්ච්චිස්කේ

ජිවිතය

ජිවිතයේ
ඔබ ලබන සෑම ජයක්ග්‍රහනයක්ම
ඉදිරියේ සතුටු නොවන්න

එහෙත්
ඒවා නිහතමානිව විදගන්න

ජිවිතයේ
ඔබ ලබන සෑම පරාජයක්ම
හමුවේ දුක් නොවන්න

මන්ද
එලෙස එන සෑම පරාජයක්ම
වෙස්වලාගත් අශිර්වාදයක් බැවින්

සෙ/බ්101188
ඉසෙ අනුර කුමාර එම්එම්



දුටුවද සබඳ

මට හිමි නැති
ඔබට හිමි
ඔබේ කියා සදහට
මා දුරස් කොට

ඔබ ලං කරගත්
සියලු වත්කම්
සිදි ගිය කල
ඔබද ලග නැත

ඔබ ලග නැති
මා ලග ඇති මනුස්සකම
දුටුවද සබද
අප ලං කල

සෙ/බ්101685
ලා/කෝ රාජපක්ෂ කේආර්ටිකේ



අම්මා

කොහා ඇවිත් ගයන සිංදු රැගෙන ඒවි නව අවුරුදු
පුංචි කැකුලු මල් වරබදු මිදුල පුරා රටා ඇන්දු
යුධ බිම මා සිටින තුරා අම්මට නැහැ සුභ අවුරුදු
දොල පාරේ වතුර බින්දු වාගෙයි නුඹේ කදුළු බිංදු

මා යුධ බිම වෙතම රැන්දු සුරතේ රැදුනු අවිය රුදුරු
නුඹේ හදවත සුමුදු වුනත් දකිනවාද සිහින නපුරු
බත බුලතින් සපරි මැදුරු තුල පිපුනයි සිනහා පොකුරු
අපට නො එන සුභ අවුරුදු ගැන කුමටද සිහින සොදුරු

මා වටකොට නැගුණු පවුරු වට ඇසුනයි වෙඩි බියකරු
වැසි බිදු වැටුනද අම්මේ වහලෙන් පොල්අතු ඈහිරු
ලතැවිලා සුසුම් හෙලා හඩනු එපා ඔබ නිරතුරු
වැටෙනා කදුලැලි දෑසින් අම්මේ පිසලයිද කවුරු

මා ඒනනද පැලට පුරුදු අමතක කර යුධ බිම රුදු
තුරුළු කර ගනීවී නේද ඔබෙ ඔය දෑතින් සුසිනිදු
සිහිකර පෙර දිනක මියුණු මගේ ලමාවිය පියකරු
කදුළු හෙලනවාද අම්මේ හැමදාමත් ලෙසට පුරුදු

ඔබ වෙත අන්නට නොලැබුනු අම්මගේ ආදර පොඩි පුතු
ගැන සිතමින් ඔබ නිරතුරු කදුලින් ගෙවුනිද අවුරුදු
ඔබේ දෙපා මත නොගැටුනු නමුදු දෑත කර එකමුතු
රිදුන් සිතින් මා වදිනෙමි දෙපා අම්මේ ඔබේ පියකරු

සෙ/240937
කෝප්‍රල් උඩගම එම්ඩබ්කේ





සිතුවිලි

කවරදාකවත් ඔබ නිවැරදි නිසා
අනෙකා වැරදි යැයි නොසිතන්න
මන්ද ඔවුන් දකින්නනේ ඔබ දකින
කෝණයෙන් නොව ඔවුන්ගේ කෝණයෙන්ය

සෙ/249467
ඉසෙ දීපාල් ටිඑම්

නැට්ට

රැව නුඹේ පට්ටයි
ඒත් හරි කට්ටයි
ලොවෙත් නැති පෙමක් දුන්
මං හරිම මොට්ටයි

කියා මට මිට්ටයි
මනස මගේ වට්ටයි
වෙන ගෑනු නැති වගේ
මගෙ හිතත් පොට්ටයි

බදාගෙන කොට්ටයි
ඇදරෙදී මෙට්ටයි
තාම විදවනා මට
එකම අඩු නැට්ටයි

සෙ/248452
ඉසෙ රුවන් කුමාර එම්එම්පේ



බුදුබණ

ඈත දිදුලන සදක් කුමකට
මෑත තනිවුන සිතක් සැදුමට
පාර වැරදුන මිනිස් සිතකට
වේය බුදුබණ මගක් සෙවුමට

සෙ/242370
ලා/කෝ ආරියපාල ඒජීඑන්

බුද්ධිමත් මිනිසා

සතුනට වඩා මිනිසා
බුද්ධිමත් යැයි කියති
නමුදු කිසිදු සත්වයෙක්
සියදිවි නසාගන්නනේ නැත

සෙ/247539
ඉසෙ රත්නායක ඊජීවයිසී



රිදවීම

අපට රිදවූ අය
අප රිදවිය යුතු නැත
ඔවුනට ඒ වේදනාව
දිනක දෛවයෙන්ම
උරුම වනු ඇතී

සෙ/249467
ඉසෙ දීපාල් ටීචම්



# INNOVATIVE SAPPERS IN CORPS OF SRI LANKA ENGINEERS

HAND HELD VEHICLE SEARCH CAMERA













First place in SF HQ (East) Army Innovation Competition

Bronze Medal in SAHASAK NIPAUM National Inventors' Competition

**Research Group**

| | | |
|---|---|---|
| Maj | MDJ Wickramarachchi USP psc SLE | |
| S/Sgt | Janake GW | 7 SLE |
| L/CPL | Sampath | WKSP |
| Spr | Chinthaka HHS | 4(V) SLE |

**History**

After the 4/21 attack, demands of field engineer troops were in large number for different commitments, they had to perform duties at all around the clock every day. Searching of vehicles, personal and places with available resources and demand of quick respond could not make in that situation. The clear mentality and precise judgment of EOD operators are the most important factor in searching operations for IED scenario, since, the 4/21 incident took a different shape in involvement of personal in suicide missions than the previous experiences with LTTE. Personal who involved in suicide missions were educated and were top rankers of the particular organization, with their beloved families including their children. The situation demands such an attentive and care full technique and equipment to search for vehicles modern nature too. It was difficult to use search mirrors to cover the complete important areas of vehicle and approach to certain places. The time taken to clearance of such place or vehicle had a proportionate with the stress of the public. Therefore, the requirement of searching for new technique and equipment was arisen to mitigate following areas; reduce the time taken for clearance without compromising security threat; the condition and alertness of the searching troops; particle and economical provision for the situation.

We could produce this camera and use effective in the field. This camera is consisted of three search heads to deal with different situation where it is demanded unattended areas of clearing might encourage bomb designers to plan such situations in future too, to keep balance psychology with appropriate technology is a highly necessity, prevention is better than cure, could conduct awareness programs too at different places for stake holders in the area. The technique and the equipment demand innovative and easy to handle by ground troops in the nature of high technical capability of countering the existing modern equipment made to the use to search and clear operation by the terrorist groups. It took immense effort to get this up to the standard by the team at time of tense situation. It included many trial practical tests rounds and involving troops to get maximum comfortability during search procedure and giving accurate and conscience inspection over the job. Following are the invented types of our product are named to recall the incident:

- **Vehicle Search Rode Camera (VSRC4/21).** This search head was designed to inspect the vehicle outer perimeter and ceiling areas of a building. It gives comfortable approach and good posture of searcher to keep his head straight for correct judgment in full concentrated neuro system. Digital screen provides the visuals of the area better than searching mirror and easy to handle with the grip and elbow guard. Provide 12 v DC supply for 8 hours by the battery back and easy charging mechanism and hanging facility provides handlers comfortability.

- **Vehicle Search Flexible Horse Camera ( VCFHC4/21).** This search head was designed to inspect front and rear areas which difficult to approach by rode camera as well inspection over suspects vehicles where owners are not available at the vicinity to get rough idea of the inside placement of any materials. This gives good approach to clear the house hold equipment

- **Vehicle Search Extended Horse Camera (VSEHC4/21).** This search head was designed to inspect the fuel tank , bowsers, ect.. with sealed , water proofed system to inspect liquid surfaces and both which could not reach by above mentioned both cameras.

These three types of cameras provide the capability of the operator to search every corner of the given vehicle or place and employing suitable heads and numbers will reduce the time taken for such operation. It decreases the tension of the audience in a big que fall in for clearance. As well keep both win- win situations to get the job done.

The camera was given first place in Security Force Headquarters East innovation competition and Bronze medal in National Inventors' Competition "SAHSAK NIPAUM"

**- Major M D J Wickramaarachchi USP psc SLE -**




# ජීවිතය සහ අභියෝග

ජීවිතය යනු උපතේ පටන්ම නොනවත්වා ගලාගෙන යන අභියෝගයකි. මවු කුසේ පිලිසිඳගත් පසු මෙලොව එලිය දැකීම මිනිසාට හමුවන්නා වූ ප්‍රථම අභියෝගයයි. මිනිසා අභියෝගයන්ට නොදැනුවත්වම මුහුණ දීමට පටන් ගන්නේ උපතේ පටන් යැයි පැවසූයේ එබැවිනි. අද වනතෙක් උපතේ පටන් මුහුණ දුන් අභියෝගයන් මොනවාදැයි විමසූවිට මනසට නැගෙන්නේ ඇවිදීම, කථා කිරීම, අකුරු ලිවීම සහ විභාග වලට පෙනී සිටීම යනාදී කාලයත් සමග නිතැතින්/නිරායාසයෙන් මුහුණ දෙන්නා වූ අභියෝගයන්ය. යම් කිසි ඉලක්කයක් ලඟා කර ගැනීම සඳහා වෙහෙස මහන්සි වී, එම ඉලක්කය ජය ගන්නා තෙක්, පැමිණෙන්නා වූ බාධක මැඩගෙන ඉදිරියට යෑම ආයාසයෙන් අභියෝග වලට මුහුණ දීම වේ. ඒ අනුව මෙම අභියෝගය ද්විත්ව ඛණ්ඩයකට යොමු කල හැකි එනම්,

- නිරායාසයෙන් මුහුණ දෙන්නා වූ අභියෝග.
- ආයාසයෙන් මුහුණ දෙන්නා වූ අභියෝග.

ආයාසයෙන් අභියෝග වලට මුහුණ දී තම ඉලක්ක සපුරාගෙන ජීවිතය ජයගත් මිනිසා ජීවිතයේ සැඳෑ සමය සැහැල්ලුවෙන් ගත කරන පුද්ගලයෙකුම වේ. එම නිසා වඩා වැදගත් වන්නේ ආයාසයෙන් අභියෝගයන්ට මුහුණ දී ජීවිතය ජයග්‍රහණයේ ඉහල හිණිපෙත්තට නැගීමයි.

අභියෝග නොතකා ජීවිතය ජයගත් මිනිසුන් ඉතිහාසගතවී ඇති අප මාතෘ භූමියෙහිද ඉතිහාසගත නොවූ චරිත ගණනාවක් ඉතා උසස් අන්දමින් දිවි ගෙවන්නේ, අත පය හතර මනාව ඇතිව, තමන්ට මෙන්ම තමන් වෙතින් යැපෙන්නන්ටද, මුළු මහත් සමාජයටම බරක් වී කිසිවක් නොකර, අලසව සහ ඉතා පහත් අන්දමින් දිවි ගෙවන පුද්ගලයන්හට නින්දිත අභියෝගයක් එල්ල කරමිනි. මෙම සටහන අතරතුර මාගේ සිතැගි වෙත පැමිණි එක් චරිතයකි. මීට වසර කිහිපයකට ඉහත දී බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති වෛද්‍ය ප්‍රදර්ශනයකදී හිස මතට බටයක් වැටී සුසුම්නාවට හානි සිදු වී ඉනෙන් පහල ප්‍රදේශය අදටත් පණ නැතිව, රෝද පුටුවෙන් ගොස් උණ, කැස්ස පවා අභියෝගයක් කරගත් මිනිසුන්ට බෙහෙත් ලබාදෙන වෛද්‍ය සමන්මලී නම් ඒ දිරිය කතය. ඇය උපාධි ප්‍රධානෝත්සවයට පවා සහභාගී වූයේ එම රෝද ද්විත්යේ ආධාරයෙනි. ඇයගේ මුළු දිවියම රෝද දෙකක් මත ධාවනය කරවීමට ඇයට සිදුවිය. ඇය අභියෝගයන්ට

අභියෝගයක් එල්ල කරනු ලැබුයේ එළෙසිනි. ඒ වෛද්‍ය ශිෂ්‍යාවකි. මැය වර්ථමානයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥවරියකි. වෛද්‍ය වරුන්ගේ නොසැලකිල්ලෙන් ඇයට අහිමිවූයේ දකුණු අතයි. දකුණු අත හුරු ඇය, ඇයගේ අවසන් විභාගයට හිඳගනු ලැබූයේ වම්අත හුරුකරගනිමිනි. එපමනක් නොව ශ්‍රී ලංකා යුධ හමුදාවේ මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේද අභියෝගයන්ට අභියෝග එල්ල කරනා ආබාධිත රණවිරුවන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ සහ විවිධ වූ ක්ෂේත්‍රයන්හි තම ඒකායන අරමුණු කරා හඹා ගොස් එම එක් එක් ක්ෂේත්‍රයන්හි ජයග්‍රහන අත් පත් කර ගනී. එවැනි අකරතැබ්බයන්ට මුහුණ දී, සියල්ල ඉන් අවසන් කොට තම ජීවිතය නිකරුණේ නාස්ති කර දමන සහ සිය දිවි හානි කර ගන්නා මිනිසුන් අතර මොවුන් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඇදහිය යුතුම පුද්ගලයන් වනවා ඇත.

උපතේදීම තම ආදරණීය මෑණියන්ගේ මුහුණ දෙස බලමින් කිරි උරා බීමට වරම් නොලැබූ දරුවන් කොතෙක් ද? තවත් දරුවන් ලෝකයේ පවතින පැහැයන් සියල්ල දකිණුයේ කළු පැහැයෙනි. එකී දරුවන්ම සාමාන්‍ය පෙළ/ උසස් පෙළ යන විභාගයන්ට මුහුණ දී ජීවිතය ජයගනු ලබන්නේ දෛවයේ හාස්කමක් මෙන්ම ඔවුන්ගේ නොපසුබට උත්සාහය සහ අපරිමිත ධෛර්‍යය නිසාවෙනි.

ජීවිතයේ අතරමැදදී බිංදුවට වැටී සාර්ථකව නැගී සිටීමට වෙර දරණ මෑත කාලයේ අපූරු චරිතයක් මාගේ මනසට නැගුණි. ඒ සක්විති රණසිංහයන්ය. ඕනෑම වර්ණයක් බිහිවන්නේ සුදු සහ කලු වර්ණ ද්විත්වයේ සුසංයෝගයෙනි. මේ ඔහුගේ සුදු පැහැති පැතිකඩේ විවරණයට අවස්ථාවයි. සියළුම දේපල රජයට පවරාග ැනීමත් සමග ඔහුට පැවතියේ ඇඳිවත පමණි. ඔහු අළු ගසා දමා නැගී සිටීමට වෙර දරන්නා වූ පුදුම මිනිසෙකි.

මිනිසෙකුගේ එකම අභිප්‍රාය වන්නේ ස්ව දියුණුවය. මෙකී දියුණුව දිවියට අභියෝගයක් කරගනිමින් පියවරෙන් පියවර ක්‍රමාණුකූලව දියුණුවේ ඉහලටම ගමන් කරන සාර්ථක මිනිසුන් මෙන්ම එක් දිනකින් දියුණුවක් ලබාගැනීමට බලාපොරොත්තු වන්නා වූ මිනිසුන්ද මේ සමාජය තුල බහුලය. එවන් පුද්ගලයන් තමන්ගේ ශ්‍රමය, කාලය කැපකොට එකී ගමන යනවා වෙනුවට ඒ සඳහා පහසු විකල්ප මාර්ග වෙත යොමුවනවා ඇත. ඊට හොදම නිදසුන වන්නේ බැංකු ණය ලබාගැනීමයි. තමන්ගේ රැකියාව, ආදායම, වියදම පිළිබද කිසිඳු විමසීමකින් තොරව අභියෝගයන් මග හැර එකවර දියුණුව කරා යාම සදාකල් පවතින්නක් නොවේ. ප්‍රතිඵලය වන්නේ ණය බර දරා ගත නොහැකිව විඳින්නට තිබෙන ජීවිතය විඳවීමයි. මෙහිදී මතක තබාගතයුතු වන්නේ තරප්පු පෙළ නම් ජීවිතයේ මුල්ම පඩියේ සිට අවසන් පඩිය දක්වා අපට එකවර නැගීසිටිය නොහැක. එසේ නම් ස්ථාවර සාර්ථකත්වයක් සඳහා අප පියවරෙන් පියවර ඉදිරියට ගොස් සාර්ථකත්වය නම් වූ අවසන් පඩිය වෙත ලඟා විය යුතුය.

අභියෝගයන්ට මුහුණ දිය නොහැකි පුද්ගලයන් තම ජීවිතය ලණු කැරැල්ලකට, වස කුප්පියකට හෝ වෙඩි උන්ඩයක් වෙත පවරනු ලැබූ අවස්ථා අපි අනේක වාරයක් දැක ඇත්තෙමු. එය කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නාක්මෙන් ලබාගන්නා වූ මිනිස් ජීවිතයට කරනු ලැබූ ඉහළම අයුක්තිය, අසාධාරණය මෙන්ම නින්දිත ක්‍රියාවක් ලෙස හුවා දැක්විය හැක. උසස් මනසක් ඇති මිනිසා නම් වූ මෙම සත්වයාට අභියෝගයන්ට මුහුණදීමට මිත්‍යාදෘෂ්ඨික සංකල්පයන් ඇවැසි වන්නේ නැත. අභියෝගයන්ට මුහුණදීමට තම හිත ශක්තිමත් කර ගැනීමට බුදුන්ගේත්, ජේසුස් වහන්සේගේත්, දෙවියන්ගේත් ආශිර්වාදයක් ඉල්ලාගැනීම මිස අන් කිසිවක් කල නොහැක. අභියෝගයන්ගෙන් පලා නොගොස් ඊළඟ තත්පරයේ අපේ ඉදිරියට පැමිණෙන අභියෝගයන්ට මුහුණ දිය යුත්තේ අප විසින්මය. එලෙස අභියෝග ජයගෙන සාර්ථකව දිවියක් උදාකරගත් පුද්ගලයාට තම මරණ මංචකය බොහෝ නිදහස්, නිවහල් ස්ථානයක් බවට පත්වනවාද නොවේද යන්න අවසානයේ මාගේ සිතැගි වෙත පැන නැගුණු පැනයයි. පිළිතුර තමන්ට අවැසි පරිදි ගොණු කිරීමට හැකිවේ. එම පිළිතුරෙන් ඔබේ දෛවය සහ ඔබගෙන් යැපෙන්නන්ගේ ජීවිත තීරණය වනු ඇත.




**- කපිතන් ඒ ඒ පී වී සුරවීර ශ්‍රීලංග -**

# තනි කකුලෙන් ක්‍රිකට් ක්‍රීඩා කර අනුශූරතාවය දිනාගත්

## ඉංජිනේරු වීරයින්ගේ පුනරාවර්ජනය

සාඩම්බර ඉතිහාසයක මතක ආවර්ජනයක් වශයෙන් 2011 වර්ෂයේ පැවති යුධ හමුදා ආබාධිත සහිත වුවන්ගේ අන්තර් රෙජිමේන්තු ක්‍රිකට් තරඟාවලියට සහභාගී වූ ඉංජිනේරු බලකා ආබාධිත රණවිරුවන් ලබා ගත් ජයග්‍රහණය පිළිබඳ සඳහන් කරන්නේ ඉතාමත් අභිමානයෙන් සහ අපගේ ගෞරවය ඔවුන් වෙත පුද කිරීමේ අරමුණෙනි. තම ශක්තිය, ධෛර්‍යය සහ ආත්ම විශ්වාසය විදහා දක්වමින්, සියළුම ආබාධිත නොවන මිනිසුන් හට ආදර්ශයක් වෙමින් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බළකායට ඉමහත් කීර්තියක් අත්කර දෙමින් ඔවුන් මෙම තරඟාවලියේ අනුශූරතාවය දිනා ගන්නා ලදී. යුධ හමුදා ආබාධිත සහිත වුවන්ගේ අන්තර් රෙජිමේන්තු ක්‍රිකට් තරඟාවලිය - 2011 සඳහා සහභාගී වී අනුශූරතාවය දිනාගත් ඉංජිනේරු බලකා ආබාධිත රණවිරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ඒකක ඉතාමත් හරසරින් යුතුව මෙසේ සඳහන් කරන්නෙමු.

| | | | |
|---|---|---|---|
| සෙ/242728 | කෝප්‍රල් | ජයතිස්ස පීඑච්අයිඩී | 6 ශ්‍රීලංඉ |
| සෙ/240540 | කෝප්‍රල් | පුෂ්ප කුමාර ඒඩබ්පීපී | 5 ශ්‍රීලංඉ |
| සෙ/242524 | කෝප්‍රල් | සෝමසිරි එස්එම්එස් (ආර්එස්පී) | 9 ශ්‍රීලංඉ |
| සෙ/238583 | කෝප්‍රල් | නලින් කුමාර යුඑස්එස් | 5 ශ්‍රීලංඉ |
| සෙ/239792 | කෝප්‍රල් | සමන් කුමාර එල්පීපීඑල් | 1 ශ්‍රීලංඉ |
| සෙ/244287 | ලාන්ස් කෝප්‍රල් | සඳරුවන් බංඩාර පීඑච්ආර්එල්(ආර්එස්පී) | 9 ශ්‍රීලංඉ |
| සෙ/240972 | ලාන්ස් කෝප්‍රල් | අජිත්සිරි කේකේ | 5 ශ්‍රීලංඉ |
| සෙ/240946 | ලාන්ස් කෝප්‍රල් | ගුණරත්න ඒඑම් | 5 ශ්‍රීලංඉ |
| සෙ/242784 | ඉසෙ | පුෂ්පකුමාර කේඒජේ | 10 ශ්‍රීලංඉ |
| සෙ/240487 | ඉසෙ | රාජපක්ෂ එස් | 1 ශ්‍රීලංඉ |

